# 8. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ අයවැය කටයුතු

## 8.1 සමස්ත නිරීක්ෂණය සහ ප්‍රතිපත්ති කාර්ය සාධනය

මැදිකාලීන රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධ රාමුව තුළ, පෞද්ගලික අංශය ප්‍රමුඛ කරගත්, විදේශ අංශයෙහි යහපත් පැවැත්මක් සහිත, උද්ධමනයයෙන් තොර, ආර්ථික වර්ධනයකට පදනම දැමීම සඳහා අයවැය හිඟය තිරසාර ලෙස අඩුකිරීමේ මාවතට යොමුකිරීම, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති කාර්ය සාධනයේ අරමුණ විය. රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ වැඩ සටහනට, බදු පදනම පුළුල් කිරීම, බදු පරිපාලනය සහ අනුකූලතාවය වැඩිදියුණු කිරීම, රාජ්‍ය මූල්‍ය දිරිගැන්වීම් යථාර්ථවත් කිරීම, බදු මගහැරීමේ ක්‍රම අවම කිරීම , රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණය කිරීම, ආනයන තීරුබදු ව්‍යුහය සරල කිරීම සහ තීරුබදු මගින් ලබාදෙන ආරක්ෂාව අඩු කිරීම ඇතුළත් විය. 1996 අයවැය , රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරනය තවදුරටත් වැඩිදියුණු කිරීමට සහ අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 6.6 ක් (දීමනාවලට පෙර සියයට 7.8 ) දක්වා අඩු කිරීමටද අපේක්ෂා කරන ලදී. අයවැය හිඟය, බැංකු නොවන මූලාශ්‍රයන් මගින් මූල්‍යකරණය කිරීමට පුරෝකථනය කරන ලදී. 1996 දී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙහි කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරන ලදී. නිෂ්කාශිත සමස්ථ අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන්, සියයට 7.8 ක් (දීමනාවලට පෙර සියයට 8.9) වූ අතර, 1995 ට වඩා අඩු වූ නමුත්, ආරක්ෂක වියදම් තියුණු ලෙස ඉහළ නැගීම, ජාතන්තර තිරිඟු මිළ ගණන් අධික ලෙස ඉහළ යාම හේතුකොට ගෙවීමට සිදුවූ තිරිඟු පිටි සහනාධාරය වැඩිවීම , පෞද්ගලිකරණ වැඩ සටහන යටතේ බලාපොරොත්තු වූ ආදායම් නොලැබීම සහ දිගුකල් පැවැති නියඟයේ සහ විදුලි බලය කපාහැරීමේ අහිතකර බලපෑම් මත රජයේ ආදායම අඩුවීම හේතුකොට ගෙන 1996 අයවැය අපේක්ෂාවන් කරා ළඟාවීමට නොහැකි විය. දේශීය අංශයේ සම්පත් සීමාවීම සහ විශේෂයෙන්ම බලශක්තිය, මහාමාර්ග, විදුලි සංදේශ සහ ජල සම්පාදන අංශයන්හි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් නිසා අයවැය අරමුණු සඳහා විදේශීය සම්පත් භාවිතය අඩුවිය. ජපාන යෙන් මුදලට එරෙහිව රුපියලෙහි අගය සියයට 7 කින් වැඩිවීම නිසා යෙන් මුදලේ ලැබීම් මත වූ දේශීය ව්‍යවහාර මුදලේ අගය ද අඩුවිය. එබැවින්, අයවැය හිඟයෙන් සියයට 82 ක් දේශීය ණයගැනීම් මගින් පියවාගන්නා ලද අතර, එහි බැංකු මූල්‍යකරණය සියයට 21 ක්ද, ඇතුළත් වේ. මේ අතර, 1999 වසර සඳහා මැදිකාලීන අයවැය පරතරය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 3.5 කට ඉලක්ක ගත කිරීමක් (දීමනාවලට පෙර දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 4.5ක) සමග 1997 වසර සඳහා එම ඉලක්කය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 6.1 ක (දීමනාවලට පෙර දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 7.3) තබා ගැනීමක් සඳහා රාජ්‍ය මූල්‍ය තත්ත්වය ශක්තිමත් කිරීමට ඇති අවශ්‍යතාවය 1997 අයවැය මගින් යළිත් අවධාරණය කරන ලදී.

බදු ව්‍යාකූලතා අඩු කරමින්, බදු සහනයන් සහ බදු වරණයන් අවම කරමින් සහ ගෙවීමට ඇති හැකියාව මත වූ මූලධර්මය යටතේ අඩු බදු අනුප්‍රමාණයක් ආදේශ කොට බදු පදනම පුළුල් කරමින්, ශක්තිමත් ආදායම් වර්ධනයක් සඳහා බදු ප්‍රතිපත්තයෙහි ප්‍රතිසංස්කරණයන් සිදු කරන ලදී. 1996 දී බද්දෙන් නිදහස් ආදායම් සීමාව ඉහළ නංවන ලද අතර, බදු අනුපාත තීරු පුළුල් කිරීම සහ අන්තර් බදු අනුපාතයන් අඩු කිරීම කරන ලදී. බදු ක්‍රමය වඩාත් පාරාදෘශ්‍ය සහ ව්‍යාකූලතා අවම වන පරිදි සැකැසීම පිණිස සේවා ආදායම් මත බදු බැර, සුදුසුකම් ලබන ගෙවීම්, තක්සේරුවන ආදායම ගණනය කිරීම, සේවා අවසාන ප්‍රතිලාභයන් සහ ආදායම් බදු මත අධිභාරයන් යන අංශයෙන්හි තවදුරටත් සංශෝධනයන් කරන ලදී.

ප්‍රාග්ධන වෙළෙඳපොළ වඩාත් ශක්තිමත් කිරීම සඳහා විවිධ බදු ප්‍රමිතින් හඳුන්වා දෙන ලදී. ප්‍රාග්ධන වෙළෙඳ පොලෙහි වඩාත් පුළුල් සහභාගිත්වයක් ලබාදීම සඳහා ඒකක භාරයන් වෙත ප්‍රදානය කරන ලද බදු විරාම කාලසීමාව තවත් වසර දෙකකින් දීර්ඝ කිරීම, කොටස් වෙළෙඳ පලින් අරමුදල් ලබන ලැයිස්තු ගත පොදු සමාගම්වල බැදුම්කරයන් සහ අනෙකුත් ණය සුරැකුම්පත් මත මුද්දර බද්ද ඉවත් කිරීම සහ කොටස් තැරැව්කරුවන්ගේ ගාස්තු සහ ගනුදෙනුවල පිරිවැය අඩු කිරීමේ අදහසින් ආයෝජන සමාගම්වල සහ ඒකක භාරයන්ගේ කොටස් ගනුදෙනු පිරිවැටුම් බද්දෙන් නිදහස් කිරීම යනාදිය මීට ඇතුළත්ය. දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව සහ ආයෝජන මණ්ඩලය විසින් ඉදිරිපත් කළ විවිධ බදු දිරිගැන්වීමේ ක්‍රමයන් ඒකාබද්ධ කිරීම සඳහා ප්‍රතිසංස්කරණයන් සිදුකරන ලදී. නිෂ්පාදන හා සේවා අංශයන්හි නියුක්ත සමාගම්වලට බදු විරාම, ව්‍යාපෘති සඳහා කරනු ලබන ආනයන සඳහා ආනයන පහසුකම් සහ පිරිවැටුම් බදු නිදහස් කිරීම් පිරිනමන ලදී. උසස් තාක්ෂණය උපයෝජනය කිරීම දිරිගැන්වීම පිණිස ප්‍රාග්ධන භාණ්ඩ ආනයනයන් සඳහා ජාතික ආරක්ෂක බද්ද, සියයට 4.5 ක් මට්ටම සියයට 0.5 දක්වා අඩු කරන ලදී.

විවිධ අංශයන් මත බදු අයකිරීමේ ඒකීයත්වය සහතික කිරීම පිණිස, ආනයන තීරුබදු සියයට 10,20 සහ 35 වශයෙන් වූ තීරු තුනකින් යුතු බදු අනුපාත ව්‍යුහයක් යටතට ගැනීමේදී, උද්ගතවූ විෂමතාවන් නිවැරදි කිරීම සඳහා තීරුබදු හා රේගු බදු ප්‍රතිසංවිධානයන් හඳුන්වා දෙනු ලැබිය. කෘෂිකර්මාන්තයේ සහ ධීවර කර්මාන්තයේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහාත්, පරිසරය සුරැකීම සහ පුළුල් දැනුම ප්‍රවර්ධනය සඳහාත්, බදු සහනයන් ප්‍රදානය කරන ලදී. කෘෂිකාර්මික ආම්පන්න සහ උපකරණ, මාළු දැල්, අමුද්‍රව්‍ය, අන්තර් භාණ්ඩ සහ පොත් පත් සහ සඟරා වැනි භාණ්ඩයන් සඳහා දැනට පවතින බදු අනුපාත ව්‍යුහය තුළ ආනයන තීරු බදු අඩු කරන ලදී.

නිෂ්පාදන බදු අයකළ හැකි මත්පැන්, සිගරැට්, පෙට්රල්, ඩීසල් සහ ඇතැම් සුඛෝපභෝගී භාණ්ඩ කිහිපයකට පමණක් නිෂ්පාදන බදු සීමාකිරීමෙන්, නිෂ්පාදන බදු ව්‍යුහය යථාර්තවත් කරන ලදී. අහිතකර මත්පැන් පරිභෝජනය අඩු කිරීමට සහ අපනයනය කිරීමේ හැකියාව අධික බීර කර්මාන්තයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා බීර මත අයකරන සුරාබද්ද අඩු කරන ලදී.

ආදායම වැඩි කර ගැනීමේ මිනුම් දණ්ඩක් ලෙස, වටිනාකම පදනම් කරගත් අනුක්‍රම පරිමාණ ක්‍රමයක් හඳුන්වා දෙමින්, මුද්දර ගාස්තු යථාර්තවත් කරන ලදී. පරිපාලනමය වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත්

වන පරිදි, ගමන් බලපත්‍ර හා වීසා ගාස්තු වැඩිකරන ලදී. මාසික වේතනාදිය රුපියල් 15,000 ඉක්මවන සේවකයින් මත ජාතිය රැකගැනීමේ දායකත්වය නමින් නව බද්දක් පනවන ලදී. දුරකථන පහසුකම් ප්‍රයෝජනයට ගන්නා ග්‍රාහකයින්ගෙන් පිරිවැටුම් බද්ද අයකර ගැනීමේ අයිතිය ලබාදෙමින් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මත විශේෂ අයකිරීම් පනවනු ලැබිය.

රජයේ වියදම් අංශය සැලකූ විට ඉකුත් වර්ෂයේදී හඳුන්වා දෙන ලද වැටුප් සංශෝධනයන් යටතේ වැටුප් වැඩි කිරීම් නොලද රජයේ සේවකයන් වෙත, අතුරු දීමනාවක් ප්‍රදානය කරන ලදී. තව ද වැටුප් නොවන රජයේ මෙහෙයුම් වියදම් හා ප්‍රමුඛතාවයෙන් අඩු රුපියල් අරමුදල් වැය කෙරෙන ප්‍රාග්ධන ව්‍යාපෘතීන්හි වියදම් සියයට 10 කින් කපා හරින ලදී. ඉකුත් වර්ෂයන්හිදී අයවැයෙන් බාහිරව රජයේ බැදීම් මත දෙන ලද ණය මගින් උද්ගතවූ වගකීම් පියවා ගැනීම සහ මූල්‍ය විනය ශක්තිමත් කර ගැනීම, මූල්‍ය පාලනය සහ ගිණුම්කරණය සඳහා තාවකාලික පිළියමක් වශයෙන්, රාජ්‍ය බැංකු දෙක හා ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත දිගුකාලීන බැදුම්කර නිකුත්කරන ලදී.

ජාත්‍යන්තර තිරිඟු මිළ ගණන් ඉහළයාම, ආරක්ෂක වියදම් වැඩිවීම සහ නියගය සහ විදුලි බලය කපාහැරීම නිසා ඇතිවූ රජයේ ආදායම් අඩුවීම වැනි අනපේක්ෂිත වර්ධනයන් තුළින් සිදුවූ මූල්‍ය තත්ත්වයේ පිරිහීම මැඩපැවැත්වීම සඳහා රජය විසින් විවිධ වූ නව ආදායම් ප්‍රම්තීන් හඳුන්වා දෙනු ලැබිය. ඒ අනුව, සිගරැට් සහ සැර මත්පැන් මත නිෂ්පාදන  බදු වැඩිකළ අතර, ප්‍රමුඛ නොවන වියදම් කපාහරින ලදී. 1996 වසර තුළදී තිරිඟු පිටි පරිපාලන මිල සැලකිය යුතු ලෙස ඉහළ දැමීමේ දැඩි තීරණයන් ගන්නා ලද අතර, ඒ අනුව තිරිඟු පිටි මිල සියයට 42 කින් ඉහළ නැගුණි. මෙම නිවැරදි මිල ගැලපීම් නිසා තිරිඟු පිටි මිල ව්‍යුහයේ පැවැති ව්‍යාකූලතා සම්පූර්ණයෙන්ම වාගේ ඉවත් වුණු නමුදු තිරිඟු පිටි සඳහා නම්‍ය නිදහස් වෙළෙඳ මිළක් සහතික කිරීම අවශ්‍ය වන අතර, එමගින් අනාගතයේදී තිරිඟු පිටි සඳහා සහනාධාර අවශ්‍යතාවය යළි පැන නැගීමේ ඉඩකඩ සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමට හැකියාව ලැබේ.

1996 වර්ෂයේදී අතිරේක මූල්‍ය පහසුකම් දේශීය අංශයෙන් අවශ්‍ය වුවද, දැඩි මූල්‍ය විනයක් පැනවීමේ අදහසින් නොපිය වූ භාණ්ඩාගාර බිල්පත් මට්ටම වූ රුපියල් දශලක්ෂ 125,000 සීමාව රජය විසින් ඉහළ නොදමන ලදී.

## 8.2 අයවැය තත්ත්වය


1996 වර්ෂයේදී නිවැරැදි රාජ්‍ය මූල්‍ය මිණුම් හඳුන්වාදීමත් සමග, සමස්ථ අයවැය හිගය, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8.9 කට සීමා වූ නමුදු 1996 අයවැය ඉලක්කයන් හා සැසඳීමේදී එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.1 ක ප්‍රමාණයකින් ඉහළ යන ලදී.

මුළු ආනයනය ප්‍රමාණයෙන් බදු අයකළ හැකි ආනයන ප්‍රමාණයේ අඩුවීම, ආනයනයන් සඳහා විවිධ බදු සහන සහ බදු නිදහස් කිරීම් නිසා ආනයන මත සාමාන්‍ය බදු අනුපාතිකය පහත වැටීම සහ බදු නොවන ආදායම් ප්‍රමාණය අඩුවීම යන කරුණු හේතුකොට රජයේ සමස්ත ආදායම 1995 පැවැති දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 20.4 සිට 1996 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 19.0 දක්වා පහත වැටුණි.

සුරාබදු ඉහළ නැංවීම් වැනි නව මිණුම් වලින් බලාපොරොත්තු වූ ප්‍රතිඵලයන්, ආර්ථික කටයුතුවල සිදුවූ සැලකිය යුතු අඩුවීම නිසා යම් ප්‍රමාණයකින් අඩුවිය. ආරක්ෂක වියදම් ඉහළයෑම, තිරිඟු පිටි සහනාධාරය, සරණාගතයන් සම්බන්ධ වියදම් සහ දේශීය ණය සඳහා වූ පොලී පිරිවැය ඉහලයාමක් පැවතියද, අනවශ්‍ය වියදම් කපාහැරීම් සඳහා ගනු ලැබූ දැඩි ක්‍රියාමාර්ගයන් නිසා වර්තන වියදම් ඉකුත් වසර හා සසදන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 23.1 සිට මෙම වසරේදී සියයට 22.2 දක්වා අඩුකර ගැනීමට හැකිවිය. 1996 දී වර්තන ගිණුමෙහි හිගය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 3.2 ක් විය.

1996 අයවැයෙන් අපේක්ෂිත රාජ්‍ය ආයෝජන ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.5 ක් වුවද, එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6.3 දක්වා පහත වැටුණු අතර, මූලික වශයෙන් විදුලි පණිවුඩ සහ බලශක්ති අංශයන්හි විදේශ සම්පත් ඌණ උපයෝජනය මෙයට හේතුවිය. රාජ්‍ය ව්‍යවසායය ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි වූ මන්දගාමී වර්ධනය නිසා 1996 අයවැයෙන් බලාපොරොත්තු වූ ශුද්ධ ණයදීම් සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 0.6 ක් වූ ඍණ වියදම සියයට 0.5 ක් දක්වා වැඩිවිය. රාජ්‍ය ආයෝජනයන්හි සිදුවූ අඩුවීම අයවැය පරතරය අඩුවීම සඳහා එක්තරා ප්‍රමාණයකට දායක වූ බව මෙයින් පැහැදිලි වේ. නමුත් මෙය රටේ යටිතල පහසුකම් සංවර්ධන ක්‍රියාවලිය සැලකීමේදී වඩා හිතකර ලක්ෂණයක් නොවේ. රාජ්‍ය ආයෝජනයන්හි ප්‍රධාන පරමාර්ථය ආර්ථිකයේ යටිතල පහසුකම් සංවර්ධනය සහ නඩත්තු කිරීම වන බැවින්, රාජ්‍ය ආයෝජන පහත් මට්ටමක අඛණ්ඩව පැවතීම, ආර්ථිකයේ මැදි හා දිගුකාලීන සංවර්ධන ප්‍රයත්නයන් කෙරෙහි අහිතකර බලපෑම් ඇති කෙරේ.

මෑතකාලීන රාජ්‍ය මූල්‍ය අංශයේ සංවර්ධනයන් සලකා බැලීමේදී ඉහළ යන ආරක්ෂක වියදම් වලට අමතරව, විශාල ප්‍රමානයක නොපිය වූ රාජ්‍ය ණය මත සීඝ්‍රයෙන් වැඩිවන පොලී පිරිවැය, රාජ්‍ය අංශයේ වැටුප් සහ කුටුම්භවලට පැවැරුම්, සමස්ථ අයවැය හිගය ඉහළ මට්ටමක පැවැතීමට ප්‍රධාන හේතූන් විය. 1996 දී සමස්ථ අයවැය හිගය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8.9 ක් වුවත්, ප්‍රාථමික හිගය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.9 ක් පමණ වූ අතර, ආරක්ෂක වියදම් අත්හල පසු අයවැය හිගය සියයට 3.2 ක් පමණක් විය. මෙයින් පිළිබිඹු වන්නේ



## සංඛ්‍යා සටහන 8.1
## රාජ්‍ය මූල්‍ය කටයුතු පිළබඳ සම්පිණ්ඩනය

රුපියල් දශලක්ෂ

| | 1992 | 1993 | 1994 | 1995 | 1996 අනුමත ඇස්තමේන්තු | 1996 තාවකාලික | 1997 අනුමත ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| මුළු ආදායම සහ දීමනා | 94,061 | 106,364 | 118,295 | 145,286 | 157,207 | 154,779 | 180,944 |
| මුළු ආදායම | 85,781 | 98,339 | 110,038 | 136,258 | 148,207 | 146,279 | 170,736 |
| බදු ආදායම | 76,353 | 85,891 | 99,417 | 118,543 | 132,645 | 130,202 | 151,451 |
| බදු නොවන ආදායම | 9,428 | 12,442 | 10,621 | 17,715 | 15,562 | 16,077 | 19,285 |
| දීමනා | 8,280 | 8,025 | 8,257 | 9,028 | 9,000 | 8,500 | 10,108 |
| වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ණය දීම | 116,974 | 140,460 | 167,768 | 200,482 | 208,485 | 214,710 | 235,570 |
| වර්තන | 89,639 | 102,288 | 127,084 | 154,159 | 169,781 | 170,629 | 177,930 |
| ප්‍රාග්ධනය | 24,949 | 33,662 | 30,391 | 41,722 | 43,203 | 40,034 | 47,879 |
| ආපසු ගෙවීම් අඩු කළ පසු ණය දීම | 2,386 | 4,510 | 10,293 | 4,601 | -4,499 | 4,047 | 9,761 |
| වර්තන ගිණුමේ අතිරික්තය (+) / හිගය (-) | -3,858 | -3,949 | -17,046 | -17,901 | -21,574 | -24,351 | -7,194 |
| අයවැය හිගය (දීමනාවලට පසු) | -22,913 | -34,096 | -49,473 | -55,195 | -51,278 | -59,932 | -54,626 |
| පියවීම | 22,913 | 34,096 | 49,473 | 55,196 | 51,278 | 59,932 | 54,626 |
| විදේශීය ණය ගැනීම් | 7,361 | 9,855 | 11,778 | 21,224 | 19,078 | 10,911 | 14,194 |
| දේශීය ණය ගැනීම් | 15,552 | 24,241 | 37,696 | 33,972 | 32,201 | 49,020 | 40,432 |
| වෙළෙඳ පොළ | 18,757 | 22,229 | 38,362 | 33,424 | 32,201 | 38,657 | 40,432 |
| බැංකු - නොවන | 21,079 | 28,308 | 37,205 | 26,359 | 32,201 | 26,313 | 40,432 |
| බැංකු | -2,322 | -6,079 | 1,157 | 7,065 | - | 12,344 | - |
| මුල්‍ය අධිකාරිය | -1,901 | -13,657 | 1,764 | 7,662 | - | 9,873 | - |
| වාණිජ බැංකු | -421 | 7,578 | -607 | -597 | - | 2,471 | - |
| අනෙකුත් ණය ගැනීම් | -3,205 | 2,012 | -666 | 548 | - | 10,363 | - |
| සටහන : අයවැය හිගය (දීමනාවලට පෙර) | -31,193 | -42,121 | -57,730 | -64,224 | (60,278) | (68,432) | (64,834) |
| **දළ දේශීය නිෂ්පාදියේ ප්‍රතිශතයක් වශයෙන්** | | | | | | | |
| මුළු ආදායම සහ දීමනා | 22.1 | 21.3 | 20.4 | 21.8 | 20.3 | 20.1 | 20.3 |
| මුළු ආදායම | 20.2 | 19.7 | 19.0 | 20.4 | 19.1 | 19.0 | 19.1 |
| බදු ආදායම | 17.9 | 17.2 | 17.2 | 17.8 | 17.1 | 16.9 | 17.0 |
| බදු නොවන ආදායම | 2.2 | 2.5 | 1.8 | 2.7 | 2.0 | 2.1 | 2.2 |
| දීමනා | 1.9 | 1.6 | 1.4 | 1.4 | 1.2 | 1.1 | 1.1 |
| වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ණය දීම | 27.5 | 28.1 | 29.0 | 30.0 | 26.9 | 27.9 | 26.4 |
| වර්තන | 21.1 | 20.5 | 21.9 | 23.1 | 21.9 | 22.2 | 19.9 |
| ප්‍රාග්ධනය | 5.9 | 6.7 | 5.2 | 6.2 | 5.6 | 5.2 | 5.4 |
| ආපසු ගෙවීම් අඩු කළ පසු ණය දීම | 0.6 | 0.9 | 1.8 | 0.7 | -0.6 | 0.5 | 1.1 |
| වර්තන ගිණුමේ අතිරික්තය (+) / හිගය (-) | -0.9 | -0.8 | -2.9 | -2.7 | -2.8 | -3.2 | -0.8 |
| අයවැය හිගය (දීමනාවලට පසු) | -5.4 | -6.8 | -8.5 | -8.3 | -6.6 | -7.8 | -6.1 |
| පියවීම | 5.4 | 6.8 | 8.5 | 8.3 | 6.6 | 7.8 | 6.1 |
| විදේශීය ණය ගැනීම් | 1.7 | 0.2 | 0.2 | 3.2 | 2.5 | 1.4 | 1.6 |
| දේශීය ණය ගැනීම් | 3.7 | 4.9 | 6.5 | 5.1 | 4.2 | 6.4 | 4.5 |
| වෙළෙඳ පොළ | 4.4 | 4.4 | 6.6 | 5.0 | 4.2 | 5.0 | 4.5 |
| බැංකු - නොවන | 5.0 | 5.7 | 6.4 | 3.9 | 4.2 | 3.4 | 4.5 |
| බැංකු | -0.5 | 012 | 0.2 | 1.1 | - | 1.6 | - |
| මුල්‍ය අධිකාරිය | -0.4 | -2.7 | 0.3 | 1.1 | - | 1.3 | - |
| වාණිජ බැංකු | -0.1 | 1.5 | -0.1 | -0.1 | - | 0.3 | - |
| අනෙකුත් ණය ගැනීම් | -0.8 | 0.4 | -0.1 | 0.1 | - | 1.3 | - |
| සටහන : අයවැය හිගය (දීමනාවලට පෙර) | -7.3 | -8.4 | -10.0 | -9.6 | -7.8 | -8.9 | -7.3 |

මූලය - ශ්‍රී ලංකා මහ බැංකුව

අයවැයෙහි ව්‍යුහාත්මක දුර්වලතාවයන් පවතින බවත්, එම ව්‍යුහාත්මක දුර්වලතාවයන් නිවැරදි කිරීම් ඉලක්ක කර ගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු බවත්ය.

අයවැය හිඟය පියවා ගැනීමේදී විදේශ සම්පත් උපයෝජනය 1995 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 3.2 සිට 1996 දී සියයට 1.4 දක්වා අඩුවූ අතර, ශුද්ධ පදනම යටතේ දේශීය සම්පත් උපයෝජනය 1995 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5.1 සිට 1996 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6.4 දක්වා ඉහළ ගියේය. මෙහිදී වැදගත් වන්නේ, 1996 අයවැයෙන් බැංකු වෙතින් මුල්‍ය පහසුකම් ලබාගැනීම ශුන්‍ය මට්ටමක පවත්වා ගැනීමට රජය අපේක්ෂා කළ ද, රුපියල් දශලක්ෂ 12,344 ක් බැංකු අංශයෙන් ණය ගැනීමට රජයට සිදුවීමයි. බැංකු අංශයෙන් මුල්‍යකරණය දළ දේශිය නිෂ්පාදිතයෙන් 1995 දී සියයට 1.1 සිට 1996 දී සියයට 1.6 දක්වා ඉහළ ගියේය. තාවකාලික අත්තිකාරම් යටතේ මහ බැංකුව ණය පහසුකම් ලබාදීම සහ විටට වෙළෙඳපොල කටයුතු තුළින් මහ බැංකුව මිලදීගත් භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය වැඩිවීම, අයවැය හිඟය එක්තරා ප්‍රමාණයකට පියවීම සඳහා මහ බැංකුවේ දායකත්වය පෙන්නුම් කරයි. ණය උපකරණ නිකුතුව මගින් බැංකු නොවන මූලාශ්‍රයන්ගෙන් සම්පත් රාශිකරණය සම්පූර්ණයෙන්ම පාහේ රුපියල් ණය සහ භාණ්ඩාගාර බිල්පත් වලින් සිදුකරන ලදී. රුපියල් ණයේ මගින් රුපියල් දශලක්ෂ 46,716 ක් රැස්කරගත් අතර ඉන් සියයට 81 කට සේවක අර්ථ සාධක අරමුදල ද සියට 12 කට ජාතික ඉතිරි කිරීමේ බැංකුව ද දායක විය. 1996 ඔක්තෝම්බර් දක්වා නිකුත් කරන ලද රුපියල් දශලක්ෂ 11,225 ක් වූ නව භාණ්ඩාගාර බිල්පත් නිකුතුව සමග නොපිය වූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් බිලියන 125 ක් වූ එහි අනුමත සීමාවට ළගාවිය. භාණ්ඩාගාර බිල්පත් සීමාව ඉහළ නොදැමීම සහ වෙළෙඳපොළ තුල කෙටිකාලීන ද්‍රවශීලතාවය ඇදගැනීමට සමත් වෙනත් රාජ්‍ය ණය උපකරණයන් නොමැතිවීම නිසා වෙනත් රාජ්‍ය ආයතන, ව්‍යවස්ථාපිත අරමුදල් සහ වෙනත් ණය ගැනීම් මගින් 1996 දී රජයට ලබාගැනීමට සිදුවූ මුළු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 10,363 ක් විය.

## 8.3 ආදායම සහ ප්‍රදානයන්

1996 වර්ෂයේ රජයේ මුළු ආදායම වූ රුපියල් දශලක්ෂ 146,279 සියයට 7 ක වර්ධනයක් සටහන් කළ අතර, එය 1995 දී වාර්තා වූ සියයට 24 ක වර්ධනය හා සැසඳිය හැක. රුපියල් දශලක්ෂ 130,202 ක් වූ බදු ආදායම සියයට 10 ක වැඩිවීමක් වාර්තා කරන ලදී. මේ අතර මුළු ආදායමින් බදු ආදායමේ කොටස, 1995 දී පැවති සියයට 87 සිට 1996 දී සියයට 89 දක්වා ඉහළ ගියේය. දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් ගත්විට, එය සමකාලසීමාව තුළදී සියයට 17.8 සිට 16.9 දක්වා පහත වැටින. බදු ආදායමේ මන්දගාමී වර්ධනය කෙරෙහි ආනයන සහ නිෂ්පාදන භාණ්ඩයන් මත පිරිවැටුම් බදු, මත්පැන් මත සුරාබදු සහ නිෂ්පාදන (විශේෂ විධිවිධාන පනත) මත බදු මගින් එකතු කරගත් ආදායම්වල පහත වැටීම මූලික ලෙස දායක විය. බදු නොවන මූලාශ්‍රයන්ගෙන් එකතු කරගත් ආදායම, 1995 දී එකතු කරගත් ආදායම හා සසඳන විට 1996 දී සියයට 9 ක පහත වැටීමක් වාර්තා විය. දේපල ආදායම සහ බැංකු අංශයේ ලාභාංශවල සැලකිය යුතු පහත වැටීම මීට හේතුවිය. 1996 දී අයවැය කටයුතු සඳහා විදේශීය ප්‍රදානයන් උපයෝජනය සියයට 6 කින් අඩුවිය.


### බදු ආදායම

1996 වසර තුළ ඇතැම් පාරිභෝගික භාණ්ඩයන් සඳහා ප්‍රදානය කරන ලද බදු සහනයන් පිළිබිඹු කරමින්, පිරිවැටුම් බදු, ආරක්ෂක බද්ද සහ සුරාබදු වලින් සමන්විත, භාණ්ඩ හා සේවා මත වූ බදු ආදායම 1995 දී පැවැති මුළු බදු ආදායමින් සියයට 60 සිට සියයට 59 දක්වා ආන්තික පහත වැටීමක් පෙන්නුම් කරන ලදී. මෙම බදුවලින් ලැබුණු ආදායම් ඉකුත් වර්ෂයේ වූ සියයට 25 ක වර්ධනය හා සසඳන විට සියයට 9 ක මන්දගාමී වර්ධනයක් වාර්තා විය.

අපනයනවලට හැර සියලුම භාණ්ඩ හා සේවාවන් මත පනවන ලද ආරක්ෂක බද්දෙන් ජනිත ආදායම රුපියල් දශලක්ෂ 16,441 කි. එය 1995 දී පැවැති සියයට 49 ක වර්ධනය හා සසඳන විට 1996 දී සියයට

රූප සටහන 8.2

ආදායම් සංයුතිය



14 ක් විය. 1996 මුළු බදු ආදායමෙන් සියයට 13 ක් මෙම මුලාශ්‍රයෙන් ලැබිණි. 1995 ජූනි සිට බලපාන පරිදි ආරක්ෂක බදු අනුපාතය සියයට 3.5 සිට 4.5 දක්වා වැඩිවීමේ බලපෑම 1996 ආදායම් එකතුව මත සම්පූර්ණ වසරක කාලය තුල පැවතුනද, ආනයන අංශයේ වර්ධනය අඩුවීම, ආනයනික ප්‍රාග්ධන භාණ්ඩ මත ආරක්ෂක බද්ද සියයට 4.5 සිට සියයට 2.0 දක්වා අඩු කිරීම සහ සිගරට් මත බදු ව්‍යුහය සංශෝධනය කිරීම මෙම බදු මත ආදායම රැස්කිරීමේ වේගය අඩුවීමට ප්‍රධාන වශයෙන් වගකිය යුතුවේ.

පිරිවැටුම් බදු ඉකුත් වර්ෂයේ පැවති සියයට 13 ක් වූ වැඩිවීම හා සසඳන විට, සියයට 3 කින් ආන්තිකව වැඩිවී රුපියල් දශලක්ෂ 37,631 ක් විය. තවද, මුළු බදු ආදායමින් පිරිවැටුම් බදු කොටස 1995 දී සියයට 31 සිට 1996 දී සියයට 29 දක්වා පහත වැටුණි. පිරිවැටුම් බදුවල මන්දගාමී වර්ධනය කෙරෙහි නිෂ්පාදන කටයුතු මත එකතු කරගත් පිරිවැටුම් බදු ප්‍රමාණය සියයට 10 කින් සහ ආනයන මත පිරිවැටුම් බදු සියයට 2 කින් පහත වැටීම හේතුවිය. ආනයන වර්ධන වේගය අඩුවීමත්, වසර තුළදී පිරිවැටුම් බදු නිදහස් කිරීම් හඳුන්වා දීමත් යන කරුණු දෙකම ආනයන මත පිරිවැටුම් බදු පහත වැටීමට හේතුවිය. බදු ප්‍රතිසංශෝධන යටතේ සිගරට් මත වූ පිරිවැටුම් බදු පදනම අඩුවීම, විදුලිබල හිඟය සහ කම්කරු නොසන්සුන්තාවය නිෂ්පාදන අංශයෙහි නිමැවුම් මට්ටම කෙරෙහි බාධකයක්ව පැවතීම සහ ඩීසල් සහ භූමිතෙල් වැනි ඛණිජ තෙල් නිෂ්පාදන පිරිවැටුම් බද්දෙන් නිදහස් කිරීමත් 1996 දී නිෂ්පාදන අංශයෙහි පිරිවැටුම් බදු එකතු කරගත් ප්‍රමාණය අඩුවීම කෙරෙහි බලපෑ ප්‍රධාන හේතූන් වූ බව හඳුනාගත හැකිය. කෙසේ වුවද, සේවා අංශයෙහි කටයුතු මත පිරිවැටුම් බදු ආදායම ඉකුත් වර්ෂයෙහි පැවැති සියයට 10 ක වැඩිවීම හා සසඳන කළ සියයට 37 ක වූ කැපී පෙනෙන වැඩිවීමක් පෙන්නුම් කළේය. බැංකු සහ මූල්‍ය සේවා, විදුලි සංදේශ, වරාය, ගුවන් ගමන් (සේවා) සහ රක්ෂණ යන සේවා අංශයන්හි කටයුතු වල සිදුවූ සීග්‍ර වර්ධනය එම අංශය මත පිරිවැටුම් බදු එකතුව සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වීමට දායක විය. මේ අතර, මධ්‍යස්ථ තනි බදු අනුපාතිකයක් සහිත භාණ්ඩ හා සේවා බදු ක්‍රමයකට මාරුවීම පහසු වීම සඳහා සියයට 6 ක් හා සියයට 10 ක් වූ පිරිවැටුම් බදු අනුපාත පිළිවෙලින් සියයට 7 ක් හා සියයට 11 ක් වශයෙන් සංශෝධනය කරන ලදී.

නිෂ්පාදන බදු මගින් ලැබුණු ආදායම ඉකුත් වර්ෂයේදී සටහන් කළ, සියයට 33 ක වර්ධනය හා සසඳන කළ 1996 දී සියයට 14 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශලක්ෂ 22,067 ක් විය. මෙම මූලාශ්‍රයෙන් ලැබුණු ආදායමේ සමස්ත වැඩිවීම සම්පූර්ණයෙන්ම සිගරට් මත අය කළ නිෂ්පාදන බදුවල කැපී පෙනෙන වර්ධනය මගින් ජනිත වූ අතර මත්පැන් හා නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත යටතේ ලේඛන ගත වූ පාරිභෝගික භාණ්ඩ මත නිෂ්පාදන බදු මගින් 1996 දී එකතු කරගත් ආදායම පහත වැටීමක් වාර්තා විය. දුම්කොළ සහ සිගරට් මත වෙන්ව අය කළ නිෂ්පාදන බදු වෙනුවට සිගරට් මත බදු අය කිරීමේ ජාත්‍යන්තර පිළිගැනීම වූ දිග සහ බර මත පදනම් වූ තනි ඒකක බද්දකට ඒකාබද්ධ කිරීම සහ 1996 ජූලි මාසයේදී, සිගරට් මත නිෂ්පාදන බදු අනුපාතිකයන්හි උන්නති සංශෝධනය සහ සිගරට් විකුණුම් වැඩිවීම යන කරුණු සිගරට් මත එකතු කරගත් නිෂ්පාදන බදු ආදායම සියයට 46 ක වැඩිවීමක් සනිටුහන් කිරීමට දායක වූ අතර පසුගිය වර්ෂයේ දී එම වැඩිවීම සියයට 11 ක් විය. මීට ප්‍රතිවිරුද්ධ ලෙස මත්පැන් මත බදු ආදායම ඉකුත් වර්ෂයේදී පැවැති සියයට 34 ක වැඩිවීම හා සසඳන විට 1996 දී සියයට 7 ක පහත වැටීමක් පෙන්නුම් කර රුපියල් දශ ලක්ෂ 5,839 ක් විය. 1996 ජූලි මාසයේදී සැර මත්පැන් මත නිෂ්පාදන බදු උන්නති සංශෝධනයක් සිදුකලද, සැර මත්පැන් නිෂ්පාදනය පහත වැටීම බදු ආදායම අඩුවීමට හේතු විය. මීට අතිරේකව, 1996 දී බීර නිෂ්පාදනය සියයට 70 කින් ශීඝ්‍ර ලෙස වැඩිවුවද 1995 නොවැම්බරයේදී බීර මත අයකරන බද්ද ලීටරයකට රුපියල් 33.60 සිට රුපියල් 10.00 දක්වා සිදුකළ කැපී පෙනෙන අඩු කිරීම නිසා සිදුවූ ආදායමේ අඩුවීම පියවා ගැනීමට නොහැකි විය. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ පැවැති නිෂ්පාදන බදු සරල කිරීම අනුව, ඉහළ එලදා හැකියාවක් සහිත පාරිභෝගික භාණ්ඩ මත පමණක් බදු අඛණ්ඩව පවත්වා ගනිමින් විශාල ප්‍රමාණයක අනෙකුත් පාරිභෝගික නිෂ්පාදන, බදු සංයුතියෙන් ඉවත් කිරීම නිසා මෙම බදු කාණ්ඩය යටතේ, එකතු කරගත් ආදායම සියයට 22 කින් පහත වැටී රුපියල් දශලක්ෂ 3,395 ක් විය. මේ අතර 1996 නොවැම්බරයේදී මිළ උන්නති සංශෝධනය සමග ස්ථාවර අනුපාත පදනමේ සිට වටිනාකම ප්‍රතිශතයක් වන පදනමකට පරිවර්තනය කිරීම මගින් පෙට්‍රල් සහ ඩීසල් වැනි ඛණිජ තෙල් නිෂ්පාදනය මත නිෂ්පාදන බදු යථාර්තවත් කරන ලදී.

ආනයන මුළු වටිනාකම 1996 දී සියයට 14 කින් වැඩිවුවද, ආනයන බදු මගින් එකතු කරගත් ආදායම සියයට 4 කින් පමණක් වැඩිවිය. මෙම ආනයන බදු ආදායමේ අඩු වර්ධනයට, කෘෂිකාර්මික උපකරණ, පොත්පත්, දැව, මාළු දැල් ආදිය සඳහා තීරු බදු අනුපාතයන් අඩු කිරීමේ සංශෝධන සහ හාල්, සීනි, අර්තාපල්, ළූණු, වියලි මිරිස් සහ මෝටර් රථ අමතර කොටස් ආදී ඇතැම් ආනයනයන් සඳහා වූ ආනයන බදු සම්පූර්ණව හෝ කොටසක් ඉවත් කිරීම හේතු වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් මුළු ආනයන වටිනාකමින් බදු අය කළ හැකි ආනයන වල වටිනාකම 1995 දී පැවැති සියයට 44 සිට 1996 දී සියයට 42 දක්වා පහත වැටිණ. ඒ අනුව, එකතු කරගත් මුළු ආනයන තීරුබදු ප්‍රමාණය මුළු ආනයන වලින් බෙදීමෙන් ලැබෙන සාමාන්‍ය ආනයන තීරුබදු අනුපාතය 1995 දී සියයට 10.0 සිට 1996 දී සියයට 9.2 දක්වා පහත වැටුණු අතර තීරුබදු අයකළ හැකි ආනයන මත සාමාන්‍ය තීරුබදු අනුපාතය, 1995 දී පැවැති සියයට 22.6 සිට 1996 දී සියයට 21.4 දක්වා පහත වැටණි.

1996 දී ආදායම් බදු ආදායම, 1995 වසරට වඩා සියයට 21 ක ශක්තිමත් වර්ධනයක් පිළිබිඹු කරමින් රුපියල් දශලක්ෂ 20,751 ක් විය. මුළු බදු ආදායමින් ආදායම් බදු කොටස, 1995 දී සියයට 14 සිට 1996 දී සියයට 16 දක්වා වැඩි වූ අතර, පසුගිය වසර දෙක තුළ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් පැවැති සියයට 2.6 හා සැසඳීමේදී 1996 දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 2.7 ක් දක්වා වැඩිවීමක් ද, වාර්තා කළේය. ආදායම් බද්දෙන් නිදහස් ආදායම් සීමාව වසරකට රුපියල් 60,000 සිට රුපියල් 100,000 දක්වා වැඩි කිරීම, බදු ස්ථරයන් පුළුල් කිරීම, අතරමැදි බදු අනුපාතයන් අඩු මට්ටමකට ගෙන ඒම සහ ආදායම් බදු මත අධිභාරයන් ඉවත් කිරීම නිසා සාමූහික නොවන ආදායම් බදු ප්‍රමාණය රුපියල් දශලක්ෂ 7,315 වූ අතර එය 1995 හා සැසඳීමේදී රුපියල් දශ ලක්ෂ 43 ක ආන්තික අඩුවීමක් වේ. මසකට රුපියල් 15,000 සහ 30,000 අතර වේතනාදිය උපයනු ලබන්නන් සඳහා සියයට 2 කුත්, රුපියල් 30,000 කට වඩා මාසික වේතනාදිය උපයනු ලබන්නන් සඳහා සියයට 3 කුත් වශයෙන් රජයේ හා පෞද්ගලික අංශයේ සේවකයන් මත පනවන ලද ජාතිය රැක ගැනීමේ දායක අරමුදල නම් වූ නව බද්දෙන් 1996 වර්ෂයේදී ලැබුණු ආදායම රුපියල් දශලක්ෂ 125 ක් විය. මේ අතර සාමූහික ආදායම්

## සංඛ්‍යා සටහන 8.2
## රාජ්‍ය ආදායම් සංයුතියෙහි සම්පිණ්ඩනය

රුපියල් දශලක්ෂ

| | 1992 | 1993 | 1994 | 1995 | 1996 අනුමත ඇස්තමේන්තු | 1996 තාවකාලික | 1997 අනුමත ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| **බදු ආදායම** | **76,353** | **85,891** | **99,417** | **118,543** | **132,645** | **130,202** | **151,451** |
| ආදායම් බදු | 10,967 | 12,543 | 15,277 | 17,161 | 17,299 | 20,751 | 21,345 |
| පෞද්ගලික | 4,067 | 5,235 | 5,621 | 7,358 | 4,787 | 7,315 | 7,825 |
| සාමූහික | 6,900 | 7,308 | 9,656 | 9,803 | 11,763 | 13,2311 | 13,120 |
| ජාතික රැකගැනීමේ අරමුදල | - | - | - | - | 750 | 125 | 400 |
| දේපල මත බදු | 3,597 | 3,493 | 4,386 | 5,162 | 5,839 | 5,279 | 6,788 |
| මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් සඳහා බදු | 1,991 | 1,073 | 471 | 1,050 | - | 1,604 | 350 |
| දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 38,158 | 47,963 | 56,685 | 70,797 | 80,807 | 77,105 | 92,883 |
| පොදු විකුණුම් සහ පිරිවැටුම් බදු | 24,095 | 29,663 | 32,300 | 36,429 | 40,695 | 37,631 | 43,478 |
| නිෂ්පාදන | 8,262 | 9,3231 | 9,171 | 9,906 | 9,699 | 8,874 | 12,023 |
| නිෂ්පාදන නොවන | 3,546 | 4,825 | 6,445 | 7,074 | 8,772 | 9,711 | 8,922 |
| ආනයන | 12,287 | 15,607 | 16,684 | 19,449 | 22,224 | 19,046 | 22,532 |
| සුරා බදු | 10,232 | 11,655 | 14,632 | 19,436 | 21,775 | 22,067 | 28,936 |
| මත්පැන් | 3,434 | 4,063 | 4,686 | 6,298 | 5,950 | 5,839 | 7,780 |
| දුම්කොළ | 5,573 | 6,866 | 7,888 | 8,788 | 11,195 | 12,833 | 15,175 |
| වෙනත් | 1,225 | 726 | 2,058 | 4,350 | 4,630 | 3,395 | 5,981 |
| ආරක්ෂක බද්ද | 3,764 | 6,589 | 9,693 | 14,408 | 16,090 | 16,441 | 18,426 |
| බලපත්‍ර ගාස්තු | 67 | 56 | 60 | 524 | 2,247 | 966 | 2,043 |
| ජාත්‍යන්තර වෙළෙඳාම මත බදු | 21,640 | 20,819 | 22,598 | 24,373 | 28,700 | 25,463 | 30,085 |
| ආනයන | 20,819 | 20,762 | 22,598 | 24,385 | 28,700 | 25,458 | 30,085 |
| අපනයන | 821 | 57 | - | 8 | - | 5 | - |
| **බදු නොවන ආදායම** | **9,428** | **12,448** | **10,621** | **17,715** | **15,562** | **16,077** | **19,285** |
| දේපල ආදායම | 6,262 | 8,154 | 7,360 | 12,856 | 10,082 | 10,059 | 12,046 |
| ඉත්: මහ බැංකුවේ ලාභ | 1,150 | 1,000 | 1,200 | 1,200 | 1,200 | 1,700 | 1,500 |
| පොලී ආදායම | 3,596 | 4,390 | 4,560 | 6,946 | 6,006 | 5,222 | 6,496 |
| වෙළෙඳ ව්‍යවසායයන්ගේ අතිරික්තය | 1,179 | - | - | - | - | - | - |
| සේවා ගාස්තු | 1,225 | 1,303 | 988 | 1,751 | 2,650 | 2,827 | 3,066 |
| අනෙකුත් බදු නොවන ආදායම | 1,941 | 2,991 | 2,273 | 3,108 | 2,830 | 3,191 | 4,173 |
| **මුළු ආදායම** | **85,781** | **96,339** | **110,038** | **136,258** | **148,207** | **146,279** | **170,836** |

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස

| ශිර්ෂය | 1992 | 1993 | 1994 | 1995 | 1996 අනුමත ඇස්තමේන්තු | 1996 තාවකාලික | 1997 අනුමත ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| **බදු ආදායම** | **18.0** | **17.2** | **17.2** | **17.8** | **17.1** | **16.9** | **17.0** |
| ආදායම් බදු | 2.6 | 2.5 | 2.6 | 2.6 | 2.2 | 2.7 | 2.4 |
| පෞද්ගලික | 1.0 | 1.0 | 1.00 | 1.1 | 0.6 | 1.0 | 0.9 |
| සාමූහික | 1.6 | 1.5 | 1.7 | 1.5 | 1.5 | 1.7 | 1.5 |
| ජාතික රැකගැනීමේ දායකත්වය අරමුදල | - | - | - | - | 0.1 | 0.0 | 0.0 |
| දේපල මත බදු | 0.8 | 0.7 | 0.8 | 0.8 | 0.8 | 0.7 | 0.8 |
| මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් සඳහා බදු | 0.5 | 0.2 | 0.1 | 0.2 | 0.0 | 0.2 | 0.0 |
| දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 0.9 | 0.6 | 0.8 | 10.6 | 10.4 | 10.0 | 10.4 |
| පොදු විකුණුම් සහ පිරිවැටුම් බදු | 5.7 | 5.9 | 5.6 | 5.5 | 5.2 | 4.8 | 4.9 |
| නිෂ්පාදන | 1.9 | 1.8 | 1.8 | 1.5 | 1.3 | 1.2 | 1.3 |
| නිෂ්පාදන නොවන | 0.8 | 1.0 | 1.1 | 1.1 | 1.1 | 1.3 | 1.0 |
| ආනයන | 2.9 | 3.1 | 2.9 | 2.9 | 2.9 | 2.5 | 2.5 |
| සුරා බදු | 2.4 | 2.3 | 2.5 | 2.9 | 2.8 | 2.9 | 3.2 |
| මත්පැන් | 0.8 | 0.8 | 0.8 | 0.9 | 0.8 | 0.8 | 0.9 |
| දුම්කොළ | 1.3 | 1.4 | 1.4 | 1.3 | 1.4 | 1.7 | 1.7 |
| වෙනත් | 0.3 | 0.1 | 0.4 | 0.7 | 0.6 | 0.4 | 0.7 |
| ආරක්ෂක බද්ද | 0.9 | 1.3 | 1.7 | 2.2 | 2.1 | 2.1 | 2.1 |
| බලපත්‍ර ගාස්තු | - | - | - | 0.1 | 0.3 | 0.1 | 0.2 |
| ජාත්‍යන්තර වෙළෙඳාම මත බදු | 5.1 | 4.2 | 3.9 | 3.6 | 3.7 | 3.3 | 3.4 |
| ආනයන | 4.9 | 4.2 | 3.9 | 3.6 | 3.7 | 3.3 | 3.4 |
| අපනයන | 0.2 | - | - | - | - | - | - |
| **බදු නොවන ආදයම** | **2.2** | **2.5** | **1.8** | **2.7** | **2.0** | **2.1** | **2.2** |
| දේපල ආදායම | 1.5 | 1.6 | 1.3 | 1.9 | 1.3 | 1.3 | 1.4 |
| ඉත්: මහ බැංකුවේ ලාභ | 0.3 | 0.2 | 0.2 | 0.2 | 0.2 | 0.2 | 0.2 |
| පොලී ආදායම | 0.8 | 0.9 | 0.8 | 1.0 | 0.8 | 0.7 | 0.7 |
| වෙළෙඳ ව්‍යවසායයන්ගේ අතිරික්තය | 0.3 | - | - | - | - | - | - |
| සේවා ගාස්තු | 0.3 | 0.3 | 0.2 | 0.3 | 0.3 | 0.4 | 0.3 |
| අනෙකුත් බදු නොවන ආදායම | 0.5 | 0.6 | 0.4 | 0.5 | 0.4 | 0.4 | 0. |
| **මුළු ආදායම** | **20.0** | **19.7** | **19.0** | **20.4** | **19.1** | **19.0** | **19.1** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

වලින් එකතු කරගත් ආදායම රුපියල් දශලක්ෂ 13,311 ක් වූ අතර එය පසුගිය වර්ෂය හා සැසඳීමේදී සියයට 36 ක වර්ධනයකි. මෙම වැඩිවීම කෙරෙහි රුපියල් දශලක්ෂ 1,476 ක එකතුවක් පිළිබිඹු කල බදු පරිපාලනයේ දියුණුව, විදුලි සංදේශ, බැංකු සහ රක්ෂණ වැනි සේවාවන්හි වර්ධනය සහ 1996 දී වරාය අධිකාරිය මගින් ගෙවන ලද රුපියල් දශලක්ෂ 1,000 ක පමණ ආදායම් බදු හිඟ මුදල් හේතු වූ බව පෙනේ.

ඉකුත් වර්ෂයේ පැවැති සියයට 18 ක වර්ධනය හා සසඳන කළ 1996 දී සියයට 2 ක ආන්තික වැඩිවීමක් වාර්තා කළ මුද්දර ගාස්තු රුපියල් දශලක්ෂ 5,279 ක් විය. අනුක්‍රම පරිමාණ ප්‍රගති පදනමක් යටතේ ඉහල ආදායමක් ලැබීම සඳහා මුද්දර ගාස්තු සංශෝධනය කර තිබියදීත් ආනයනවල මන්දගාමී වර්ධනය සහ බැඳුම්කර සහ ණය සුරැකුම්පත් මුද්දර බද්දෙන් නිදහස් කිරීම නිසා පුළුල් වූ ආදායම් ප්‍රමිතීන් මගින් අපේක්ෂිත ඉහළ ආදායම් නොලැබිණ.

## බදු නොවන ආදායම්

දේපළ ආදායම් 1995 පැවැති රුපියල් දශලක්ෂ 12,856 සිට 1996 දී රුපියල් දශලක්ෂ 10,059 දක්වා අඩුවීම මූලිකව හේතුකොට ගෙන මුළු බදු නොවන ආදායම 1996 දී සියයට 9 ක අඩුවීමක් වාර්තා කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ජනනය කරන ලද ලාභ මාරු කිරීම් 1996 දී රුපියල් දශලක්ෂ 1,700 ක් විය. ජාතික සංවර්ධන බැංකුව සහ සංවර්ධන මූල්‍ය සංස්ථාව විසින් ගෙවීමට තිබූ පොලී සඳහා කල් ගැනීම, 1996 වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසායය මත මූල්‍ය පනත යටතේ රජයට ගෙවීමට නියම කරන ලද විශේෂ අයකිරීම් අඩුවීම සහ රාජ්‍ය බැංකු වෙතින් සාපේක්ෂව අඩු ලාභාංශ ප්‍රමාණයන් ලැබීම දේපල ආදායම් අඩුවීම කෙරහි ප්‍රධාන ලෙස බලපෑය. මේ අතර වීසා සහ ගමන් බලපත්‍ර ගාස්තු සියයට 20 කින් වැඩි කිරීමේ වර්ෂය පුරා පැවැති බලපෑම මත ගාස්තු සහ අයකිරීම් මගින් ලැබූ ආදායම 1995 පැවැති රුපියල් දශලක්ෂ 1,751 සිට 1996 දී රුපියල් දශලක්ෂ 2,827 දක්වා වැඩිවිය. වෙනත් බදු නොවන ආදායම් සියයට 13 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 3,191 ක් වූ අතර මෙම වැඩිවීම කෙරෙහි සමාජ සංරක්ෂණ දායක මුදල්වල සිදු වූ සැලකිය යුතු වැඩිවීම මූලික හේතුව විය.

## විදේශ ප්‍රදානයන්

අයවැය කටයුතු සඳහා 1996 වර්ෂයේදී උපයෝජනය කරන ලද විදේශ ප්‍රදානයන් සියයට 6 ක අඩුවීමක් වාර්තා කරමින් රුපියල් දශලක්ෂ 8,500 ක් විය. විදේශ ප්‍රදානයන් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පසුගිය වර්ෂ වලදී නොකඩවා අඩු වූ අතර, එම මට්ටම පසුගිය වර්ෂයේ පැවැති සියයට 1.4 සිට 1996 දී තවදුරටත් අඩු වී සියයට 1.1 ක් විය. ව්‍යාපෘති සහ වැඩ සටහන් සඳහා ලැබූ ප්‍රදානයන් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 6,140 වූ අතර භාණ්ඩ සහ ආහාර සඳහා ලැබූ ප්‍රදානයන් රුපියල් දශලක්ෂ 1,236 ක් විය. මීට අමතරව, තාක්ෂණික සහයෝගිතාවන් යටතේ රුපියල් දශලක්ෂ 362 ක් ලැබුණු අතර ඉතිරි රුපියල් දශලක්ෂ 761 වර්ගීකරණය නොකළ ප්‍රදානයන් යටතේ ලැබුණි. මීට පෙර වර්ෂවල ලෙසම ජපානය රුපියල් දශලක්ෂ 2,880 ක ප්‍රදානයන් ලබා දෙමින් ප්‍රධාන ආධාර දෙන රට ලෙස සටහන් කළ අතර දෙවන ස්ථානය රුපියල් දශලක්ෂ 2,424 ක් ප්‍රදානය කළ නෝර්වේ රටට හිමි විය.

## 8.4 වියදම

රුපියල් දශලක්ෂ 214,710 ක් වූ රජයේ මුළු වියදම් හා ශුද්ධ ණයදීම්, ඉකුත් වර්ෂයේ පැවැති සියයට 19 ක වැඩිවීම හා සසඳන විට 1996 දී සියයට 7 ක වැඩිවීමක් සනිටුහන් කළේය. කෙසේ වුව ද, මුළු වියදම් දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් 1995 දී වූ සියයට 30.0 සිට 1996 දී සියයට 27.9 දක්වා තියුණු ලෙස පහත වැටුණි. රුපියල් දශලක්ෂ 170,626 ක් වූ වර්තන වියදම් මුළු වියදමින් සියයට 79 ක් වූ අතර, එය ඉකුත් වර්ෂය හා සසඳන විට සියයට 77 ක් විය. 1996 දී රජයේ ආයෝජන ප්‍රමාණය සියයට 8 ක පහත වැටීමක් පෙන්නුම් කරමින් රුපියල් දශලක්ෂ 48,370 ක් විය. එය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් 1995 දී වූ සියයට 8.0 සිට 1996 දී සියයට 6.2 දක්වා පහත වැටුණි.


## වර්තන වියදම්

1996 දී සියයට 11 ක වර්ධනයක් වාර්තා කළ වර්තන වියදම් රුපියල් දශලක්ෂ 170,629 ක් වූ අතර, එය 1996 දී දළ දේශීය නිෂ්පාදිතයේ නාමික වර්ධන අනුපාතය වූ සියයට 15 හා සැසඳීමේ දී සැළකිය යුතු අන්දමින් පහත මට්ටමක පැවතිණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් වර්තන වියදම් 1995 දී වූ සියයට 23.1 සිට 1996 දී සියයට 22.2 දක්වා පහත වැටුණි. 1996 අයවැයහි ඇතුලත් පුනරාවර්තන වියදමෙහි ප්‍රධාන ශීර්ෂයන් පිළිබඳව විග්‍රහ කිරීමේ දී ආරක්ෂක වියදම්, රාජ්‍ය අංශයේ වැටුප්, විශ්‍රාම වැටුප් සහ රාජ්‍ය ණය මත පොලී ගෙවීම් ඉකුත් වර්ෂයෙහි මෙන්ම 1996 දී ද, මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 77 ක් ව පැවැති බව පෙනේ. වර්තන ස්වභාවයෙහි වූ සම්පත් වැය කිරීම පිළිබඳව දැඩි පාලනයක් පැවතිය ද, 1996 දී ආරක්ෂක වියදම් වැඩිවීම නිසා වර්තන වියදම් සඳහා අයවැයෙන් අපේක්ෂිත ඉලක්කය වූ දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 21.9 ට සීමාකරගැනීමට රජය අපොහොසත් විය.

1995 ගුරු වැටුප් සංශෝධනය අනුව යමින් එම වසරේ දී කවර හෝ වැටුප් වැඩිවීමක් නොලද සියලුම රජයේ සේවකයින් සඳහා වැටුප් පරීක්ෂණ කොමිසමේ නිර්දේශයන්ට අනුකූලව වැටුප් ඉහල නංවන ලදී. නව වැටුප් සංශෝධනයන් ක්‍රියාත්මක වන තෙක් රු. 100 ක මාසික අතුරු දීමනාවක් ප්‍රථම හය මාසය තුළ දී ද රුපියල් 250 ක මාසික දීමනාවක් ජූලි මාසයේ සිට ද ගෙවන ලදී. මෙහි ප්‍රතිඵල වශයෙන්, සේවක පඩිනඩි මත මුළු පිරිවැය 1995 දී පැවැති රුපියල් දශලක්ෂ 34,909 සිට 1996 දී රුපියල් දශලක්ෂ 38,332 දක්වා සියයට 10 කින් ඉහළ ගියේ ය. ආරක්ෂක සේවාවන් සඳහා වූ දශලක්ෂ 13,337 ක වැටුප් ඇතුලත්ව මුළු වැටුප් හා වේතන සඳහා වූ වියදම 1996 දී සියයට 10 ක වැඩිවීමක් වාර්තා කරන ලදී. වැටුප් හා වේතන වියදම් මුළු වර්තන වියදමින් සියයට 22 ක් වූ අතර, එය රජයේ මුළු ආදායමින් සියයට 26 ක් විය. කෙසේ වුවද, මුළු වැටුප් හා වේතන දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන්, 1995 දී වූ සියයට 5.2 හා සසඳන විට 1996 දී සියයට 5.0 දක්වා පහත වැටුණි.

1995 දී පැවැති ආන්තික වැඩිවීම හා සසඳන විට, රාජ්‍ය ණය මත පොලී ගෙවීම් සියයට 20 ක සැලකිය යුතු වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශලක්ෂ 46,021 ක් වූ අතර, දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන්

රූප සටහන 8.3
**වියදම් සංයුතිය**




එය, ඉකුත් වසරේ පැවැති සියයට 5.7 සිට සියයට 6.0 දක්වා වැඩිවිය. රුපියල් දශලක්ෂ 39,282 ක් වූ දේශීය ණය මත පොලී පිරිවැය, ඉකුත් වසරට වඩා සියයට 23 ක වැඩිවීමක් පෙන්නුම් කළේය. රුපියල් සුරැකුම්පත් මත ගෙවන ලද රුපියල් දශලක්ෂ 20,311 ක් වූ පොලී ප්‍රමාණය සියයට 12 ක වැඩිවීමක් වාර්තා කල අතර, රුපියල් ණය මත සාමාන්‍ය පොලී අනුපාතය සියයට 13.8 ක් විය. රුපියල් ණය ප්‍රමාණය, බැඳුම්කර නිකුත් කිරීම් හැරුණු විට රුපියල් දශලක්ෂ 24,174 කින් වැඩිවීම සහ 1996 ප්‍රථම භාගය තුළ දී සියයට 13-15 පරාසයක වාර්ෂික ඉහළ පොලී අනුපාතයක් සහිත රුපියල් ණය නිකුත් කිරීම නිසා 1996 වර්ෂයේ දී රුපියල් ණය මත පොලී පිරිවැය ඉහළ නැගුණි. මේ අතර 1996 ප්‍රථම මාස දහය තුළ රුපියල් දශලක්ෂ 11,225 ක් වූ නව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම්, 1995 වසරෙහි සිට 1996 පෙබරවාරි දක්වා පැවැති ඉහළ පොලී අනුපාතිකයන් සහ තුන්මස් භාණ්ඩාගාර බිල්පත් අධික ලෙස 1996 දී නිකුත් කිරීම නිසා භාණ්ඩාගාර බිල්පත් මත පොලී පිරිවැය, සියයට 29 ක වැඩිවීමක් සනිටුහන් කරමින් රුපියල් දශලක්ෂ 18,053 ක් විය. භාණ්ඩාගාර බිල්පත් පොලී ව්‍යුහයේ මෑතකාලීන වෙනස්වීම් සලකා බැලීමේ දී කල්පිරීමේ කාලසීමාව එක් වසරක් වූ භාණ්ඩාගාර බිල්පත් මත වූ පොලී අනුපාතය 1994 දී වර්ෂයකට සියයට 12.20 - 19.43 දක්වා ද, 1995 දී වර්ෂයකට 13.68 - 20.45 දක්වා ද 1996 දී වර්ෂයට 14.40 - 19.05 දක්වා ද වූ පරාසයක පැවැති බව පෙනේ. භාණ්ඩාගාර බිල්පත් නොපියවූ ප්‍රමාණය රුපියල් බිලියන 125 ක් වූ අනුමත සීමාවට පැමිණීම නිසා භාණ්ඩාගාර බිල්පත් මගින් ණය ගැනීම සීමාවීමෙන් 1996 දී භාණ්ඩාගාර බිල්පත් මත මුළු පොලී පිරිවැය තවදුරටත් වැඩිවීම වැලැක්විණි. ඉකුත් වසරෙහි පැවැති සියයට 14.10 ක් වූ භාණ්ඩාගාර බිල්පත් මත වූ සාමාන්‍ය වාර්ෂික පොලී අනුපාතිකය 1996 දී සියයට 15.86 ක් විය. 1996 දී විදේශීය ණය මත පොලී පිරිවැය සියයට 9 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 6,739 ක් වූ අතර, අයවැය ඇස්තමේන්තුවල සඳහන් වූ එම පොලී ප්‍රමාණය රුපියල් දශලක්ෂ 7,351 ක් විය. දිගු සහන කාලසීමාවකින් යුත් අඩු පිරිවැය සහනදායී ණය ලබාගැනීමට රජයට හැකිවීම සහ 1996 වසර තුළ දී ශ්‍රී ලංකා රුපියලට එදිරිව ජපන් යෙන් මුදල සියයට 7 කින් අගය අඩුවීම (ජපන් යෙන් මත මුළු නොපියවූ විදේශීය ණය වගකීම සියයට 30 කි), 1996 විදේශීය ණය මත අඩු පොලී පිරිවැයක් ඇතිවීමට හේතු වූ සාධකයන් ලෙස හඳුනාගත හැකිය. විදේශීය ණය ප්‍රමාණය මත වූ සාමාන්‍ය පොලී අනුපාතය 1995 දී සියයට 1.8 හා 1996 දී සියයට 1.9 ක් වූ අතර එම අගයයන් නොපියවූ විදේශී ණය වල සහනදායී ස්වභාවය පිළිබිඹු කෙරේ.

කුටුම්භ, රාජ්‍ය සංස්ථා සහ ආයතනයන් සහ අනෙකුත් ප්‍රාදේශීය රාජ්‍ය ආයතනයන් වෙත කරන ලද සංක්‍රාම ඇතුළත් මුළු සංක්‍රාම ගෙවීම් ප්‍රමාණය, රුපියල් දශලක්ෂ 46,813 ක් වෙමින් සියයට 16 ක වැඩිවීමක් වාර්තා කරන ලද අතර ඉකුත් වසරෙහි එම වැඩිවීම සියයට 18 ක් විය. 1995 දී හා 1996 දී වැවිලි සමාගම් 13 ක් පුද්ගලීකරණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, වැවිලි අංශ වෙත වර්තන පැවරුම් අඩුවී තිබියදීත් රාජ්‍ය සංස්ථාවල සංක්‍රාමයන් සියයට 5 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 8,232 ක් වූ අතර, එයට ප්‍රධාන වශයෙන් 1996 වසරේ දුම්රිය සහ තැපැල් යන දෙපාර්තමේන්තුවල මෙහෙයුම් පාඩු වැඩිවීම් හා තිරිඟු පිටි අලෙවිය මත වූ සහනාධාර පිරිවැය අධික වීම හේතු විය. 1996 වසර තුළ දී තිරිඟු පිටි කිලෝවක මිල රුපියල් 11.95 සිට රු. 16.95 දක්වා ක්‍රමයෙන් වැඩිකර තිබියදීත්, සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ (ස.තො.ස) පිටි විකුණුම් වලින් සිදුවූ පාඩු සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු වර්තන පැවරුම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 5,515 ක් වූ අතර, එය ඉකුත් වසරේ දී රුපියල් දශලක්ෂ 6,200 ක් විය. ජාත්‍යන්තර වෙළඳපලේ තිරිඟු පිටි මිල (පිරිවැය සහ ගැල්කුලී සාමාන්‍ය) 1995 දී මෙට්‍රික් ටොන් එකකට එ.ජනපද ඩොලර් 186 සිට 1996 දී මෙට්‍රික් ටොන් එකකට එ.ජනපද ඩොලර් 221 දක්වා සියයට 19 කින් තියුණු ලෙස වැඩිවීම, එ.ජනපද ඩොලරයට එරෙහිව රුපියලෙහි විනිමය අනුපාතිකය සියයට 8 කින් පහත වැටීම සහ තිරිඟු පිටි බෙදාහැරීමේ මෙහෙයුම් පිරිවැය වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1995 දී තිරිඟු පිටි අලෙවිය මත වූ සාමාන්‍ය පාඩුව කිලෝවකට රුපියල් 9.02 හා සසඳන විට සංශෝධිත තිරිඟු පිටි මිළ යටතේ 1996 දී කිලෝවකට වූ පාඩුව රුපියල් 6.97 ක් පමණ විය. 1995 දී අලෙවි කරන ලද තිරිඟු පිටි මෙට්‍රික් ටොන් 683,683 හා සසඳන විට 1996 දී තිරිඟු පිටි අලෙවිය, මෙට්‍රික් ටොන් 692,164 ක ඉහළ මට්ටමක තවදුරටත් පැවතුණි. වී නිෂ්පාදනය සියයට 27 කින් පහත වැටීම නිසා සහල් සැපයුමේ හිඟයන් ඇතිවීම සහ ආනයනික සහල්වල මිල අධික වීමේ ප්‍රතිඵලයක් වයෙන් සහල් මිල තියුණු ලෙස ඉහළ යාම 1996දී තිරිඟු පිටි පරිභෝජනය ඉහළ මට්ටමක පැවැතීමට ප්‍රධාන හේතුව විය. ඉහත සඳහන් සාධකයන් තුනෙහි ඒකාබද්ධ

## සංඛ්‍යා සටහන 8.3
## ආර්ථික වර්ගීකරණයට අනුව වියදම සහ ශුද්ධ ණය දීම

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1992 | 1993 | 1994 | 1995 | 1996 අනුමත ඇස්තමේන්තු | 1996 තාවකාලික | 1997 අනුමත ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| **වර්තන වියදම** | **89,639** | **102,288** | **127,084** | **154,159** | **169,781** | **170,629** | **177,930** |
| භාණ්ඩ හා සේවා වියදම | 39,692 | 44,895 | 54,700 | 75,447 | 82,519 | 78,666 | 83,086 |
| වැටුප් හා වේතන | 20,793 | 26,332 | 29,309 | 34,909 | 39,978 | 38,332 | 44,603 |
| වෙනත් භාණ්ඩ හා සේවා | 18,898 | 18,563 | 25,391 | 40,538 | 42,541 | 40,334 | 38,483 |
| පොළී ගෙවීම් | 25,940 | 30,203 | 38,031 | 38,225 | 44,057 | 46,021 | 49,800 |
| විදේශීය | 4,739 | 5,102 | 5,551 | 6,162 | 7,351 | 6,739 | 8,338 |
| දේශීය | 21,201 | 25,101 | 32,520 | 32,063 | 36,706 | 39,282 | 41,462 |
| වර්තන පැවැරුම් හා සහනාධාර | 24,007 | 27,190 | 34,180 | 40,487 | 48,105 | 46,813 | 44,044 |
| රාජ්‍ය සංස්ථාවන්ට | 1,428 | 1,571 | 2,634 | 7,841 | 6,308 | 8,232 | 2,239 |
| රාජ්‍ය ආයතනයන්ට | 1,649 | 2,031 | 1,976 | 2,182 | 2,739 | 2,284 | 3,931 |
| වෙනත් රාජ්‍ය ආයතනයන්ට | 1,111 | 896 | 1,307 | 1,157 | 1,512 | 1,592 | 1,464 |
| කුටුම්භ සහ අනෙකුත් අංශයන්ට | 19,819 | 22,692 | 28,263 | 29,307 | 37,545 | 34,706 | 36,410 |
| ආහාර මුද්දර, ආහාර සහනාධාර යනාදිය | 4,466 | 4,580 | 4,654 | 1,799 | 1,082 | 506 | 385 |
| ජනසවිය / සමෘද්ධි | 3,098 | 3,685 | 5,369 | 5,130 | 11,794 | 8,591 | 8,692 |
| විශ්‍රාම වැටුප් | 8,099 | 10,516 | 13,271 | 14,549 | 16,825 | 15,465 | 18,075 |
| පොහොර සහනාධාර | - | - | 630 | 1,345 | 1,500 | 1,500 | 1,500 |
| වෙනත් | 4,156 | 3,911 | 4,339 | 6,484 | 6,345 | 8,644 | 6,658 |
| ඌණ වියදම් සඳහා ප්‍රතිපාදන | - | - | - | - | -4,900 | -872 | 1,000 |
| **ප්‍රාග්ධන වියදම්** | **24,949** | **33,6632** | **30,391** | **41,722** | **43,203** | **40,034** | **47,879** |
| මූර්ත වත්කම් අත්පත් කර ගැනීම් | 12,604 | 19,719 | 16,747 | 22,589 | 27,313 | 24,576 | 28,726 |
| ප්‍රාග්ධන පැවරුම් | 4,610 | 4,311 | 4,246 | 7,614 | 5,123 | 6,017 | 6,371 |
| රාජ්‍ය සංස්ථාවන්ට | 6,663 | 8,551 | 8,433 | 10,446 | 12,119 | 9,603 | 11,532 |
| රාජ්‍ය ආයතනයන්ට | 1,028 | 1,036 | 914 | 1,057 | 1,000 | 1,042 | 1,200 |
| වෙනත් රාජ්‍ය ආයතනයන්ට | 44 | 45 | 51 | 17 | 49 | 39 | 50 |
| වෙනත් | - | - | - | - | -2,400 | -1,243 | - |
| **ආපසු ගෙවීම් අඩුකල පසු ණය දීම** | 2,386 | 4,510 | 10293 | 4,601 | -4,499 | 4,047 | 9,761 |
| අත්තිකාරම් ගිණුම් | -150 | 410 | 2,462 | -1,580 | 500 | 630 | 500 |
| ණය දීම | 6,246 | 6,265 | 10,064 | 11,087 | 15,313 | 8,336 | 12,665 |
| ප්‍රතිව්‍යුහකරණය පිරිවැය | 1,750 | 1,465 | 3,739 | 3,191 | 4,792 | 2,992 | 6,492 |
| පෞද්ගලිකරණය වියදම් | -2,850 | -1,200 | -2,996 | -3,001 | -21,000 | -4,728 | -5,000 |
| ණය ආපසු ගෙවීම් | -2,610 | -2,430 | -2,976 | -5,097 | -4,104 | -3,182 | -4,896 |
| **මුළු වියදම සහ ශුද්ධ ණයදීම** | **116,974** | **140,460** | **167,768** | **200,482** | **208,485** | **214,710** | **235,570** |

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන්

| ශීර්ෂය | 1992 | 1993 | 1994 | 1995 | 1996 අනුමත ඇස්තමේන්තු | 1996 තාවකාලික | 1997 අනුමත ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| **වර්තන වියදම** | **21.1** | **20.5** | **21.9** | **23.1** | **21.9** | **22.2** | **19.9** |
| භාණ්ඩ හා සේවා වියදම | 93 | 90 | 94 | 113 | 106 | 102 | 93 |
| වැටුප් හා වේතන | 49 | 53 | 51 | 52 | 52 | 52 | 50 |
| වෙනත් භාණ්ඩ හා සේවා | 44 | 37 | 44 | 61 | 55 | 52 | 43 |
| පොළී ගෙවීම් | 61 | 60 | 66 | 57 | 57 | 60 | 56 |
| විදේශීය | 11 | 10 | 10 | 0.9 | 0.9 | 0.9 | 0.9 |
| දේශීය | 50 | 05 | 06 | 48 | 4.7 | 51 | 46 |
| වර්තන පැවැරුම් හා සහනාධාර | 56 | 54 | 59 | 61 | 62 | 61 | 4.9 |
| රාජ්‍ය සංස්ථාවන්ට | 03 | 03 | 05 | 12 | 08 | 11 | 03 |
| රාජ්‍ය ආයතනයන්ට | 04 | 04 | 03 | 03 | 0.4 | 03 | 0.4 |
| වෙනත් රාජ්‍ය ආයතනයන්ට | 03 | 02 | 02 | 02 | 02 | 02 | 02 |
| කුටුම්භ සහ අනෙකුත් අංශයන්ට | 47 | 45 | 49 | 44 | 48 | 45 | 41. |
| ආහාර මුද්දර, ආහාර සහනාධාර යනාදිය | 11 | 0.9 | 08 | 03 | 01 | 0.1 | 0.1 |
| ජනසවිය / සමෘද්ධි | 0.7 | 0.7 | 09 | 08 | 05 | 01 | |
| විශ්‍රාම වැටුප් | 19 | 21 | 23 | 22 | 22 | 20 | 20 |
| පොහොර සහනාධාර | 0.0 | 0.0 | 0.1 | 02 | 02 | 02 | 02 |
| වෙනත් | - | - | 0.7 | 10 | 08 | 01 | 0.7 |
| ඌණ වියදම් සඳහා ප්‍රතිපාදන | - | - | - | - | -06 | -0.1 | - |
| **ප්‍රාග්ධන වියදම්** | **5.9** | **6.7** | **5.2** | **6.2** | **5.6** | **5.2** | **5.4** |
| මූර්ත වත්කම් අත්පත් කර ගැනීම් | 30 | 39 | 29 | 34 | 35 | 32 | 32 |
| ප්‍රාග්ධන පැවරුම් | 29 | 28 | 24 | 29 | 24 | 22 | 21 |
| රාජ්‍ය සංස්ථාවන්ට | 11 | 09 | 0.7 | 11 | 0.7 | 08 | 0.7 |
| රාජ්‍ය ආයතනයන්ට | 02 | 02 | 02 | 0.2 | 01 | 01 | 01 |
| වෙනත් රාජ්‍ය ආයතනයන්ට | 0.0 | 00 | 0.0 | 0.0 | 0.0 | 00 | 0.0 |
| වෙනත් | - | - | - | - | - | -02 | 00 |
| **ආපසු ගෙවීම් අඩුකල පසු ණය දීම** | **0.6** | **0.9** | **1.8** | **0.7** | **-0.6** | **0.5** | **1.1** |
| අත්තිකාරම් ගිණුම් | - | 01 | 04 | -0.2 | 01 | 01 | 01 |
| **මුළු වියදම සහ ශුද්ධ ණයදීම** | **27.5** | **28.1** | **29.0** | **30.0** | **26.9** | **27.9** | **26.4** |

බලපෑම් එනම්, ආනයනික තිරිඟු පිටිවල මිල අධික වීම, රුපියලේ අගය අඩුවීම සහ තිරිඟු පිටි පරිභෝජනය ඉහළ මට්ටමක පැවැතීම හේතුවෙන් 1996 දී තිරිඟු පිටි විකුණුම් මත සැලකිය යුතු ප්‍රමාණයක සහනාධාරයක් අවශ්‍ය වීම නිසා, තිරිඟු පිටිවල දේශීය මිල ගැලපීමේ බලපෑම සමහන් විය. මේ අතර, රාජ්‍ය ආයතනයන්ට කරන ලද සංක්‍රාමයන් 1995 දී රුපියල් දශලක්ෂ 2,182 සිට 1996 දී රුපියල් දශලක්ෂ 2,282 දක්වා ආන්තික ලෙස වැඩිවිය. කෙසේ වුව ද, සංස්ථා සහ ආයතනයන්ට කරන ලද මුළු වර්තන පැවරුම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් 1995 දී පැවැති සියයට 1.5 සිට 1996 දී සියයට 1.4 දක්වා පහත වැටුණි.

රජයේ දුම්රිය දෙපාර්තමේන්තුවේ සහ තැපැල් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් පාඩු මත වු සංක්‍රාම ගෙවීම් ඉකුත් වර්ෂයේ පැවැති පාඩුවලට වඩා සියයට 21 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 1,232 ක් විය. 1996 මාර්තු මාසයේ දී දුම්රිය ගාස්තු සියයට 15 කින් වැඩි කල ද ශ්‍රී ලංකා දුම්රිය සේවයෙන් එකතු ක්‍ර ගත් මුළු ආදායම, 1995 දී රුපියල් දශලක්ෂ 947 සිට 1996 දී රුපියල් දශලක්ෂ 938 දක්වා ආන්තික වශයෙන් පහත වැටුණු අතර, පුනරාවර්තන වියදම සියයට 5 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 1,326 ක් විය. මේ අතර තැපැල් දෙපාර්තමේන්තුව එකතු කරගත් ආදායම් ප්‍රමාණය වු රුපියල් දශලක්ෂ 1,326 ක ප්‍රමාණය 1995 දී වාර්තා වු ආදායම් මට්ටමට සම වු නමුදු වර්තන වියදම් සියයට 7 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 1,670 ක් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, තැපැල් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් පාඩු සියයට 48 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 344 ක් වු අතර, දුම්රිය දෙපාර්තමේන්තුවෙහි එම පාඩුව සියයට 13 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 888 ක් විය. 1996 දී තැපැල් සහ දුම්රිය සේවයෙහි සිදු වු මුළු මෙහෙයුම් පාඩු ප්‍රමාණය එම නිසා රුපියල් දශලක්ෂ 1,232 ක් විය.

1996 දී විශ්‍රාම වැටුප් සහ අනෙකුත් සුභසාධන වලින් සමන්විත කුටුම්භ සංක්‍රාමයන්, සියයට 18 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් රුපියල් දශලක්ෂ 34,706 ක් විය. 1996 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2 ක් වු විශ්‍රාම වැටුප් ගෙවීම් සියයට 6 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 15,465 ක් විය. මෙම වැඩිවීම 1996 දී කල් ඉකුත් වු ජීවන වියදම් දීමනාව ගෙවීම සහ නව විශ්‍රාමිකයන් 8,000 ක් පමණ එකතු වීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය. මේ අතර ආහාර මුද්දර, භූමිතෙල් මුද්දර, ජනසවිය සමෘද්ධි වැනි බහුවිධ සුභසාධක වැඩසටහන් තනි සුභසාධක වැඩසටහනකට ඒකාබද්ධ කිරීමේ මුලික පියවරයන් ගන්නා ලද අතර, එය සමෘද්ධි වැඩසටහන යටතේ ක්‍රියාත්මක කෙරෙනු ඇත. සමෘද්ධි, ජනසවිය, ආහාර මුද්දර, භූමිතෙල් මුද්දර, ළදරු කිරි ආහාර, පාසැල් වාර ප්‍රවේශපත්‍ර, නොමිලේ පාසැල් පොත්, නොමිලේ පාසැල් නිල ඇඳුම් සහ ත්‍රිපෝෂ වැනි වැඩසටහන් යටතේ, 1996 කුටුම්භ වෙත කරන ලද සෘජු සහනාධාර සියයට 21 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 12,735 ක් විය. 1996 දී වසර ආරම්භයේ සිට පාසැල් දිවා ආහාර වැඩසටහන නවත්වන ලද නමුත්, සමෘද්ධි වැඩසටහන යටතේ මුළු අර්ථලාභීන් සංඛ්‍යාව, 1995 දී පැවැති 1,213,535 සිට 1996 දී 1,458,888 දක්වා වැඩිවීමත් සමග සමෘද්ධි නියාමකයින් සංඛ්‍යාව 23,648 දක්වා සහ සමෘද්ධි පරීක්ෂකවරුන් සංඛ්‍යාව 1,337 දක්වා වැඩිවීම 1996 දී සුභසාධන වියදම් සැලෙන ප්‍රමාණයකින් වැඩිවීම කෙරෙහි බලපාන ලදී. උතුරු හා නැගෙනහිර පළාත්වල පැවැති ගැටුම් තත්ත්වය උග්‍රවීම නිසා අවතැන් වූ පවුල් සංඛ්‍යාව වැඩිවීම හේතුවෙන්, සරණාගතයන් සම්බන්ධ සහන වැඩසටහන් මත වූ වියදම 1995 දී පැවති රුපියල් දශලක්ෂ 2,325 සිට 1996 දී රුපියල් දශලක්ෂ 3,275 දක්වා වැඩි විය. මේ අතර පොහොර සහනාධාර වැඩසටහනේ පිරිවැය 1995 දී දශලක්ෂ 1,345 සිට 1996 දී රුපියල් දශලක්ෂ 1,500 දක්වා වැඩිවීම මුලික ලෙස පොහොර භාවිතය ඉහළයාම නිසා සිදුවිය. මෙම වියදම්හි ප්‍රතිඵලයක් ලෙස දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස කුටුම්භවලට කරන ලද වර්තන ගෙවීම් 1995 දී සියයට 4.4 සිට 1996 දී සියයට 4.5 දක්වා ආන්තික වැඩිවීමක් පෙන්නුම් කළේය. මෙහෙයුම් අරමුණු සඳහා අවශ්‍ය වු විවිධ භාණ්ඩ හා සේවා මත සිදු කරන ලද වර්තන වියදම් ප්‍රමාණය ඉකුත් වසරේ වු රුපියල් දශලක්ෂ 40,538 හා සසඳන විට 1996 දී රුපියල් දශලක්ෂ 40,344 දක්වා වු ආන්තික ලෙස අඩුවිය. මෙම අඩුවීම 1996 දී සිවිල් පරිපාලන වියදම් සහ ආරක්ෂක වියදම්වල ආන්තික අඩුවීමේ ප්‍රතිඵලයකි. ආරක්ෂක නොවන කාර්යයන් මත අනෙකුත් භාණ්ඩ හා සේවා වර්තන වියදම් සීමාකිරීම සඳහා ගන්නා ලද දැඩි ක්‍රියාමාර්ග හේතුවෙන්, එකී වියදම් 1995 දී රුපියල් දශලක්ෂ 9,495 හා සසඳනවිට 1996 දී ආන්තික ලෙස අඩුවී රුපියල් දශලක්ෂ 9,485 ක් විය.

කාර්යයන් අනුව වර්ගීකරණයට අනුව අධ්‍යාපනය, සෞඛ්‍යය, සුභසාධනය සහ ප්‍රජා සේවාවන්ගෙන් සමන්විත සමාජ සේවා වර්තන වියදම් රුපියල් දශලක්ෂ 59,294 ක් වු අතර, එය මුළු වර්තන වියදමින් සියයට 35 ක් විය. අධ්‍යාපනය හා සෞඛ්‍යය මත වූ වර්තන වියදම් සමාජ සේවාවන් මත වූ මුළු වියදමින් සියයට 43 ක් වූ අතර, සුභසාධක කටයුතු සඳහා වියදම් සියයට 55 ක් විය. කෙසේ වුව ද, සමාජ සේවාවන් මත වූ මුළු වියදම 1995 දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 8.6 සිට 1996 දී සියයට 7.7 දක්වා පහත වැටිණි.

1996 දී ආර්ථික සේවාවන්හි නඩත්තු සහ මෙහෙයුම් කටයුතු සඳහා වෙන් කරන ලද වර්තන වියදම් ප්‍රමාණය, සියයට 9 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 8,807 ක් විය. 1996 දී ප්‍රවාහන සහ සන්නිවේදනය සහ වාණිජ හා වෙළඳ වැනි ආර්ථික සේවාවන් මෙම වැඩිවීම සඳහා විශාල වශයෙන් හේතු විය.

1996 දී සාමාන්‍ය පොදු සේවාවන් මත රුපියල් දශලක්ෂ 53,169 ක් වු වර්තන වියදම සියයට 11 ක වැඩිවීමක් පෙන්නුම් කරන ලද අතර එය මුළු වර්තන වියදමින් සියයට 31 ක් විය. මෙය ප්‍රධාන වශයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සහ පළාත් සභාවල වියදම් වැඩිවීම් නිසා සිවිල් පරිපාලන වියදම් සියයට 56 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 10,207 වීම සහ ආරක්ෂක සහ නීතිය සහ මහජන ආරක්ෂාව මත වියදම සියයට 4 න් වැඩිවී රුපියල් දශලක්ෂ 42,961 වීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයකි.

## රාජ්‍ය ආයෝජනය

ප්‍රාග්ධන වියදම් සහ රාජ්‍ය ව්‍යවසායයන්ට දෙන ලද ණය වලින් සමන්විත වු රාජ්‍ය ආයෝජන සියයට 8 කින් පහත වැටී රුපියල් දශලක්ෂ 48,370 ක් වු අතර, දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් 1995 දී සියයට 8.0 සිට 1996 දී සියයට 6.2 දක්වා පහත වැටිණ. රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් අත්පත් කර ගන්නා ලද මුර්ත වත්කම් සහ රාජ්‍ය සංස්ථාවන්ට, ආයතනයන්ට හා වෙනත් රාජ්‍ය ආයතනයන්ට කරන ලද ප්‍රාග්ධන පැවරුම් වලින් සමන්විත ප්‍රාග්ධන වියදම් 1995 දී පැවැති රුපියල් දශලක්ෂ 41,722 සිට 1996 දී රුපියල් දශලක්ෂ 40,034 දක්වා සියයට 4 ක පහත වැටීමක් වාර්තා වු අතර, රාජ්‍ය ව්‍යවසායයන්ට දෙන ලද ණය 1995 දී රුපියල් දශලක්ෂ 11,087 සිට රුපියල් දශලක්ෂ 8,336 දක්වා පහත වැටුණි. රාජ්‍ය ආයෝජන වැඩසටහන යටතේ රජයේ අමාත්‍යංශ සහ දෙපාර්තමේන්තු විසින් අත්පත් කර ගන්නා ලද මුර්ත වත්කම් වලින් ප්‍රාග්ධන සම්භාරයේ

## සංඛ්‍යා සටහන 8.4
## කාර්යයන් අනුව වියදම්හි වර්ගීකරණය

| ශීර්ෂය | 1992 | 1993 | 1994 | 1995 | 1996 අනුමත ආනයන | 1996 තාවකාලික | 1997 අනුමත ආනයන |
|---|---|---|---|---|---|---|---|
| **වර්තන වියදම** | | | | | | | |
| **සාමාන්‍ය පොදු සේවා** | **24,453** | **27,564** | **30,444** | **47,888** | **48,400** | **53,168** | **54,955** |
| සිවිල් පරිපාලනය | 7,099 | 7,405 | 4,637 | 6,562 | 16,202 | 10,207 | 13,431 |
| ආරක්ෂක කටයුතු | 12,876 | 15,413 | 19,415 | 35,186 | 25,180 | 37,370 | 33,528 |
| පොදු නීතිය හා ආරක්ෂාව | 4,478 | 4,746 | 6,392 | 6,140 | 7,018 | 5,591 | 7,997 |
| **සමාජ සේවා** | **32,700** | **37,476** | **47,656** | **57,648** | **63,194** | **59,294** | **58,740** |
| අධ්‍යාපනය | 10,533 | 11,225 | 14,836 | 15,784 | 13,231 | 16,018 | 13,407 |
| සෞඛ්‍ය | 4,518 | 5,711 | 7,666 | 8,818 | 10,566 | 9,260 | 12,054 |
| සුභසාධන | 17,378 | 20,255 | 24,560 | 32,106 | 38,550 | 32,824 | 31,824 |
| නිවාස | - | - | - | - | - | - | - |
| ප්‍රජා සේවා | 271 | 285 | 593 | 941 | 847 | 1,191 | 1,455 |
| **ආර්ථික සේවා** | **3,834** | **4,328** | **6,195** | **8,078** | **8,169** | **8,807** | **8,532** |
| කෘෂිකර්මය හා වාරිමාර්ග | 1,398 | 1,483 | 2,506 | 3,826 | 3,448 | 3,894 | 4,175 |
| ධීවර | 68 | 107 | 99 | 105 | 178 | 148 | 199 |
| නිෂ්පාදන සහ කැනීම් | 349 | 403 | 351 | 252 | 702 | 282 | 650 |
| බලශක්ති සහ ජල සම්පාදන | 133 | 93 | 518 | 990 | 810 | 590 | 728 |
| ප්‍රවාහන සහ සන්නිවේදනය | 1,208 | 1,346 | 2,024 | 2,014 | 1,974 | 2,423 | 1,822 |
| වෙළඳාම සහ වාණිජ්‍යය | 232 | 203 | 72 | 172 | 287 | 891 | 241 |
| වෙනත් | 446 | 693 | 625 | 719 | 771 | 580 | 718 |
| **අනෙකුත්** | **28,652** | **32,920** | **42,789** | **40,546** | **54,918** | **50,231** | **55,703** |
| ඉත්: පොලී ගෙවීම | 25,940 | 30,203 | 38,031 | 38,687 | 44,057 | 46,021 | 49,800 |
| **ඌණ වියදම් සඳහා ප්‍රතිපාදන** | - | - | - | - | -4,900 | -872 | - |
| **මුළු වර්තන වියදම්** | **89,639** | **102,288** | **127,084** | **154,159** | **169,781** | **170,629** | **177,930** |
| **ප්‍රාග්ධන වියදම් සහ ණය දීම්** | | | | | | | |
| **සාමාන්‍ය පොදු සේවා** | **1,970** | **4,085** | **2,390** | **5,776** | **4,335** | **2,827** | **3,810** |
| සිවිල් පරිපාලනය | 1,256 | 3,463 | 1,753 | 3,962 | 3,226 | 1,602 | 3,810 |
| පොදු නීතිය හා ආරක්ෂාව | 714 | 622 | 637 | 1,814 | 1,109 | 1,226 | - |
| **සමාජ සේවා** | **6,136** | **6,075** | **7,677** | **9,854** | **12,363** | **11,185** | 13,676 |
| අධ්‍යාපනය | 2,008 | 2,845 | 2,877 | 3,124 | 4,418 | 4,384 | 4,552 |
| සෞඛ්‍ය | 2,023 | 1,353 | 1,519 | 2,134 | 3,661 | 2,768 | 3,965 |
| සුභසාධන | 1,191 | 1,084 | 1,681 | 1,690 | 1,145 | 1,068 | 852 |
| නිවාස | 767 | 604 | 802 | 1,610 | 1,256 | 1,606 | 1,526 |
| ප්‍රජා සේවා | 148 | 189 | 798 | 1,297 | 1,882 | 1,359 | 2,786 |
| **ආර්ථික සේවා** | **20,444** | **29,600** | **29,304** | **36,106** | **43,170** | **34,519** | **41,808** |
| කෘෂිකර්මය හා වාරිමාර්ග | 5,890 | 5,682 | 5,179 | 6,060 | 6,525 | 5,491 | 6,233 |
| ඉත්: මහවැලි යෝජනා ක්‍රමය | 2,670 | 2,810 | 2,598 | 3,090 | 2,133 | 1,940 | 1,655 |
| ධීවර | 175 | 124 | 368 | 361 | 542 | 311 | 525 |
| නිෂ්පාදනය හා කැනීම් | 184 | 1,471 | 22 | 250 | 1,019 | 379 | 1,256 |
| බලශක්ති සහ ජල සම්පාදන | 5,527 | 4,728 | 5,518 | 5,003 | 6,914 | 6,035 | 7,949 |
| ප්‍රවාහනය හා සන්නිවේදනය | 4,363 | 10,165 | 14,522 | 18,888 | 19,696 | 14,898 | 18,468 |
| වෙළඳාම සහ වාණිජ්‍යය | 365 | 364 | 182 | 20 | 353 | 105 | 321 |
| වෙනත් | 3,940 | 7,066 | 3,513 | 5,524 | 8,121 | 7,300 | 7,056 |
| **අනෙකුත්** | **1,072** | **1,081** | **1,084** | **1,074** | **1,049** | **1,082** | **1,250** |
| **ඌණ වියදම් සඳහා ප්‍රතිපාදන** | - | - | - | - | - 2,400 | - 1,243 | - |
| **මුළු ප්‍රාග්ධන වියදම හා ණයදීම** | **29,622** | **40,841** | **40,455** | **52,810** | **58,516** | **48,369** | **60,544** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වැඩිවීම් සියයට 9 කින් ඉහළ ගොස් රුපියල් දශලක්ෂ 24,576 ක් විය.

මේ අතර රුපියල් දශලක්ෂ 15,620 ක් වූ රාජ්‍ය සංස්ථාවන්ට සහ ආයතනයන්ට කරන ලද ප්‍රාග්ධන පැවැරුම් සියයට 14 ක පහත වැටීමක් පිළිබිඹු කිරීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 1996 දී මහවැලි අධිකාරියට සහ මාර්ග සංවර්ධන අධිකාරියට පවරන ලද, ප්‍රාග්ධන පැවැරුම් පහත වැටීමයි. මීට අමතරව 1995 දී නැව් සංස්ථාව වෙත රුපියල් දශලක්ෂ 2,395 ක් වූ ඉහළ මට්ටමේ ප්‍රාග්ධන පැවැරුමක් ලබා දීම ද 1996 වසරේ සාපේක්ෂකව ප්‍රාග්ධන පැවැරුම් ප්‍රමාණය අඩුවීමට, හේතු විය. යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කාර්යයෙහි සෘජුවම සම්බන්ධ වූ මාර්ග සංවර්ධන අධිකාරිය (රුපියල් දශලක්ෂ 4,404), නාගරික සංවර්ධන අධිකාරිය (රුපියල් දශලක්ෂ 776), දකුණු පළාත් සංවර්ධන ව්‍යාපෘතිය (රුපියල් දශලක්ෂ 334), ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය (රුපියල් දශලක්ෂ 3,313) සහ ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩලය (රුපියල් දශලක්ෂ 2,414) වැනි රාජ්‍ය ආයතනයන්ට ප්‍රාග්ධන පැවැරුම් වල දී ප්‍රමුඛත්වය දෙන ලදී.

රාජ්‍ය සංස්ථාවන් සහ ආයතනයන් විසින් සිදු කරන ලද ප්‍රාග්ධන වියදම් සඳහා අරමුදල් සපයා ගැනීමේ දී රජය මගින් ලබා දුන් රුපියල් දශලක්ෂ 8,335 ක් වූ ණය ප්‍රමාණය 1996 අයවැය ප්‍රතිපාදන වලින් සියයට 54 ක් පමණි. මෙම පහත වැටීම, වරාය සංවර්ධන අධිකාරිය විසින් වරාය සංවර්ධන ව්‍යාපෘති වලින් ඉතිරි කර ගත් රුපියල් දශලක්ෂ 2,355 ක් වූ විශාල ප්‍රාග්ධන ප්‍රමාණය සහ ශ්‍රී ලංකා ටෙලිකොම් (රුපියල් දශලක්ෂ 947), ලංකා විදුලිබල මණ්ඩලය (රුපියල් දශලක්ෂ 1,837) සහ අනෙකුත් ව්‍යවසායයන් ඇතුළුව සිදු වූ රුපියල් දශලක්ෂ 4,254 ක ප්‍රාග්ධන ඌණ උපයෝජනයන්හි ඒකාබද්ධ ප්‍රතිඵලයකි. ජයා බහාලු පර්යන්තය ඉදිකිරීම අදියර III සහ IV

සඳහා වරාය සංවර්ධන අධිකාරියට ලබාදුන් රුපියල් දශලක්ෂ 5,100 ක් වූ අයවැය ප්‍රතිපාදන වලින් රුපියල් දශලක්ෂ 2,745 ක පිරිවැයකින් මෙම ව්‍යාපෘති දෙකම සම්පූර්ණ කරන ලද බැවින් ඉන් ප්‍රාග්ධන වියදම් වලින් ලේඛනයෙන් ඉතිරි කරගත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 2,355 කි. මෙම ඉතිරියට ප්‍රධාන වශයෙන්, ව්‍යාපෘතීන් දෙක සඳහාම ජාත්‍යන්තර වෙළඳපොලේ තරඟකාරී මිල ගණන් යටතේ, යන්ත්‍ර සහ උපකරණ තොග වශයෙන් මිලට ගැනීම ප්‍රධාන ලෙස හේතු විය. පරිපාලන ක්‍රියාමාර්ගයන් හි සිදු වූ ප්‍රමාදයන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී සිදු විය හැකි පාරිසරික ප්‍රශ්න, ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා ටෙලිකොම් සහ වෙනත් ආයතයනයන්හි සංවර්ධන කටයුතු කෙරෙහි බලපාන ලද අතර එය 1996 දී සම්පත් ඌණ උපයෝජනය සඳහා වගකිව යුතු වේ.

කාර්යයන් අනුව වර්ගීකරණයට අනුව 1996 ආර්ථික සේවා මත රාජ්‍ය ආයෝජන රුපියල් දශලක්ෂ 34,519 දක්වා සියයට 4 ක පහත වැටීමක් සනිටුහන් කල ද එය මුළු රාජ්‍ය ආයෝජන වලින් සියයට 71 ක් වූ අතර, ඉකුත් වසර හා සසඳන විට එය සියයට 68 ක් විය. ගමනාගමන සහ සන්නිවේදන අංශයෙන් ආර්ථික සේවා මත කරන ලද මුළු වියදමින් සියයට 43 ක් හෝ රුපියල් දශලක්ෂ 14,898 ක් වූ අතර, ඉන් මාර්ග සංවර්ධන අධිකාරිය (රුපියල් දශලක්ෂ 4,404), වරාය අධිකාරිය (රුපියල් දශලක්ෂ 2,776) සහ ශ්‍රී ලංකා ටෙලිකොම් (රුපියල් දශලක්ෂ 2,406) යන ආයතනවලට කරන ලද ප්‍රාග්ධන වියදම් ගමනාගමනය සහ සන්නිවේදනය මත වූ මුළු ප්‍රාග්ධන පිරිවැයෙන් සියයට 64 ක් හෝ රුපියල් දශලක්ෂ 9,586 ක් විය. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රාග්ධන වියදම, කෘෂිකර්ම හා වාරිමාර්ග සේවා මත වූ ප්‍රාග්ධන වියදමින් සියයට 35 ක් වූ අතර, එය ආර්ථික සේවා මත වූ මුළු ප්‍රාග්ධන වියදමින් සියයට 7 ක් විය. මේ අතර, 1996 දී බලශක්තිය සහ ජල සම්පාදන අංශය මත රාජ්‍ය ආයෝජන සියයට 21 ක වැඩිවීමක් පෙන්නුම් කරමින්, රුපියල් දශ ලක්ෂ 6,035 ක් විය. මෙම අංශය, ආර්ථික සේවාවන්හි මුළු ප්‍රාග්ධන වියදමින් සියයට 17 ක් නියෝජනය කෙරිණ. ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය දෙනු ලැබූ රුපියල් දශ ලක්ෂ 3,313 ක් සහ ලංකා විදුලි බල මණ්ඩලය (ලංවිම) සඳහා ණයට දෙන ලද රුපියල් දශ ලක්ෂ 2,721 ක් බලශක්තිය සහ ජලසම්පාදන සේවා මතවූ ප්‍රාග්ධන වියදම් සම්පූර්ණයෙන්ම වාගේ නියෝජනය කරන ලදී.

අධ්‍යාපනය, සෞඛ්‍යය, සුභසාධනය, නිවාස සහ ප්‍රජා සේවා ඇතුලත් සමාජ සේවාවන් මත රාජ්‍ය ආයෝජන සියයට 14 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 11,185 ක් වූ අතර එය 1996 මුළු රාජ්‍ය ආයෝජන වලින් සියයට 23 ක් විය. අධ්‍යාපනය මත රුපියල් දශලක්ෂ 4,384 ක් සහ සෞඛ්‍යය මත රුපියල් දශලක්ෂ 2,768 ක් වූ ආයෝජන පිළිවෙලින් සියයට 40 ක හා සියයට 30 ක වැඩිවීමක් පිළිබිඹු කළේය. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් උසස් අධ්‍යාපන අංශය තුළ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සඳහා සිසු නේවාසිකාගාර, ඉදිකිරීම් මත වියදම් සහ සෞඛ්‍ය අංශය, වැඩි දියුණු කිරීමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සහ ප්‍රාග්ධන වත්කම් ප්‍රවර්ධනය සේවා සඳහා වියදම් වැඩිවීම නිසා සිදුවිය. මේ අතර විශේෂ සුභසාධන සේවා මත වියදම් සියයට 37කින් පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 1996 දී කලින් පැවැති සුභ සාධන වැඩසටහන් ඉලක්ක ගත කිරීම හා ඒකාබද්ධ කිරීමයි. 1996 දී රුපියල් දශලක්ෂ 2,827 ක් වූ සාමාන්‍ය රාජ්‍ය සේවාවන් මත ප්‍රාග්ධන ආයෝජනය සියයට 51 ක වාර්තාගත අඩුවීම ප්‍රධාන වශයෙන් සිවිල් පරිපාලන අංශයෙහි ප්‍රමුඛස්ථ නොවන ප්‍රාග්ධන වියදම් කපා හැරීම සඳහා දැඩි පිළිවෙතක් අනුගමනය කිරීම නිසා සිදුවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, පරිපාලනය මත මුළු ප්‍රාග්ධන වියදම් 1995 දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 0.9 සිට 1996 දී සියයට 0.4 දක්වා පහත වැටිණ.

## 8.5 පළාත් සභා

13 වන ව්‍යවස්ථා සංශෝධනය තුළින් 1987 අංක 42 දරණ පනතින් පළාත් සභා පිහිටුවීමේ මූලික අරමුණ වූයේ පරිපාලනමය බලතල එම සභාවලට අනුයුක්ත කිරීමෙන් තීරණ ගැනීමේ කටයුතු විමධ්‍යගත කිරීමය. එම පළාත් සභාවලට දී ඇති බලතල මගින්, ඒවායේ මෙහෙයුම් වියදම් පියවීමට තරම් ප්‍රමාණවත් ආදායමක් ජනනය කළ නොහැකි වී ඇති නිසා පළාත් සභා යටතේ සිදු කිරීමට පවරන ලද මෙහෙයුම් වියදම් සඳහා මධ්‍යම ආණ්ඩුව මගින් ප්‍රතිපාදන ලබාදෙනු ලැබේ. මෙම මුදල් මධ්‍යම ආණ්ඩුව මගින් සාමූහික ප්‍රදාන යටතේ ලබාදෙනු ලබන අතර, පළාත් සභා යටතේ පවරන ලද ප්‍රාග්ධන කටයුතු සඳහා උපමාන පාදක ප්‍රදාන ලබාදෙනු ලැබේ.

පළාත් සභා මගින් නිෂ්පාදන සහ පාරිභෝගික බදු, දේපල මත බදු, දේපල ආදායම්, විකුණුම් හා ගාස්තු සහ ප්‍රාග්ධන භාණ්ඩ විකුණුම් වලින් 1995 වර්ෂයේදී එකතු කරන ලද ආදායම රුපියල් දශලක්ෂ 4,440 හා සසඳන විට 1996 දී සියයට 10 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 4,884 ක් විය. නිෂ්පාදන හා පාරිභෝගික බදු කාණ්ඩය යටතේ ඇති තොග හා සිල්ලර ව්‍යාපාර මත පිරිවැටුම් බදු, බලපත්‍ර ගාස්තු සහ අනිකුත් බදුවලින් ලද ආදායම රුපියල් දශලක්ෂ 3,416 වූ අතර, එය එකතු කරන ලද මුළු

**සංඛ්‍යා සටහන 8.5**
**පළාත් සභාවල අයවැය තත්ත්වය**

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1995 | 1996 (අ) |
|---|---|---|
| **1. මුළු ආදායම** | **4,440.3** | **4,884.4** |
| 11 නිෂ්පාදනය සහ වියදම මත බදු | 3,180.8 | 3,416.3 |
| පිරිවැටුම් බදු | 2,335.2 | 2,463.8 |
| බලපත්‍ර ගාස්තු | 839.8 | 946.2 |
| වෙනත් බදු | 5.8 | 6.3 |
| 12 ලාභ සහ ලාභාංශ | 68.2 | 67.1 |
| 13 විකුණුම් හා ගාස්තු | 317.0 | 355.4 |
| 14 මුද්දර බදු | 867.1 | 1,036.0 |
| 15 වෙනත් | 7.2 | 9.6 |
| **2. මුළු වියදම්** | **20,852.6** | **22,128.1** |
| 21 වර්තන වියදම් | 19,795.3 | 20,941.3 |
| කාර්යයන් අනුව වර්ගීකරණය | 19,795.3 | 20,941.3 |
| පළාත් පරිපාලනය | 2,066.9 | 1,941.9 |
| ආර්ථික සේවා | 755.1 | 833.8 |
| සමාජ සේවා | 16,973.3 | 18,165.6 |
| ආර්ථික වර්ගීකරණය | 19,795.3 | 20,941.3 |
| වැටුප් හා වේතන | 16,030.6 | 16,262.6 |
| වෙනත් | 3,764.6 | 4,678.7 |
| 22 ප්‍රාග්ධන වියදම් | 1,057.3 | 1,186.8 |
| ප්‍රාග්ධන භාණ්ඩ අත්පත්කර ගැනීම | 593.7 | 756.6 |
| ප්‍රාග්ධන පැවැරුම් | 66.4 | 52.9 |
| වෙනත් | 397.2 | 377.3 |
| **3. පියවීම** | **15,288.0** | **16,872.7** |
| 31 සාමූහික ප්‍රදාන | 14,065.9 | 15,830.6 |
| 32 උපමාන පාදක ප්‍රදාන | 897.1 | 800.0 |
| 33 අනුරූපිත ප්‍රදාන | 325.0 | 242.1 |

(අ) තාවකාලික

මූලයයන් - සමුපකාර පළාත් සභා සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

ආදායමෙන් සියයට 70 ක් වූ අතර, පසුගිය වර්ෂය හා සසඳන විට සියයට 7 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. තොග හා සිල්ලර ව්‍යාපාර මත පිරිවැටුම් බදු මගින් ලද ආදායම 1995 වර්ෂයේදී සියයට 6 ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් දශලක්ෂ 2,464 ක් විය. තොග හා සිල්ලර ව්‍යාපාර වලින් වැඩි ප්‍රමාණයක් මත අය කරන ලද පිරිවැටුම් බදු අනුපාතය සියයට 1 ක් වූ අතර, දැව හා ගෘහ භාණ්ඩ වෙළඳුම් වැනි කටයුතු සඳහා එය සියයට 5 ක් විය. පසුගිය වර්ෂයේදී රුපියල් දශලක්ෂ 840 ක් වූ බලපත්‍ර ගාස්තු ආදායම 1996 වර්ෂයේදී සියයට 13 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 940 ක් විය. මෝටර් රථ හා මත්පැන් හල් සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සඳහා අයකරනු ලැබූ ගාස්තු මෙම කාණ්ඩයට අයත් ප්‍රධාන ආදායම් මාර්ග විය.

1996 වර්ෂයේදී මුද්දර බදුවලින් ලද ආදායම රුපියල් දශලක්ෂ 1,036 ක් වූ අතර, එය සියයට 19 ක වැඩිවීමකි. උසාවි මගින් අයකරන ලද දඩ හා මෝටර් රථ වාහන පනත යටතේ එකතු කරන ලද දඩ හා ගාස්තු මුලික වශයෙන් අඩංගු වූ විකුණුම් හා ගාස්තු මගින් 1996 වර්ෂයේදී එකතු කරන ලද ආදායම රුපියල් දශලක්ෂ 335 ක් වූ අතර, මෙය පසුගිය වර්ෂය හා සසඳන විට සියයට 12 ක වැඩිවීමකි.

පළාත් සභා මගින් එකතු කරන ලද මුළු ආදායම සලකා බැලීමේදී බස්නාහිර පළාත් සභාව මගින් එකතු කරන ලද ආදායම රුපියල් දශලක්ෂ 3,232 වූ අතර එය 1996 දී පළාත් සභා මගින් එකතු කරන ලද මුළු ආදායමෙන් සියයට 66 ක් විය. මධ්‍යම, වයඹ හා දකුණු පළාත් සභා මගින් 1996 දී එකතු කරන ලද ආදායම සියයට 8 බැගින් වූ අතර, බස්නාහිර පලාත් සභාව ඇතුළුව මෙම පළාත් සභා 4 මගින් එකතු කරන ලද ආදායම මුළු පළාත් සභා ආදායමෙන් සියයට 90 ක් විය.

1996 දී පළාත් සභා සඳහා වූ පුනරාවර්තන වියදම පසුගිය වසරට වඩා සියයට 6 ක වර්ධනයක් පිළිබිඹු කරමින් රුපියල් දශලක්ෂ 20,941 ක් විය. මෙම වර්තන වියදමෙන් සියයට 70 ක් වැටුප් හා වේතන සඳහා වෙන්වුණු අතර එය රුපියල් දශලක්ෂ 16,263 ක් විය. මෙම වැටුප් හා වේතන කාර්යයන් අනුව සලකා බැලීමේදී අධ්‍යාපනය (රුපියල් දශලක්ෂ 11,634) සෞඛ්‍යය (රුපියල් දශලක්ෂ 2,850) සහ ප්‍රාදේශීය පරිපාලන කටයුතු (රුපියල් දශලක්ෂ 548) යන කාර්යයන් සඳහා වැයවුණු අතර, එය 1996 දී මුළු වැටුප් හා වේතන සඳහා වූ වියදමින් සියයට 92 ක් විය.

මේ අතර අධ්‍යාපනය (රුපියල් දශලක්ෂ 11,948), සෞඛ්‍යය (රුපියල් දශලක්ෂ 3,562) පළාත් පාලන (රුපියල් දශලකෂ 1,614) සමාජ සේවා (රුපියල් දශලක්ෂ 639) සහ ප්‍රාදේශීය සභා පරිපාලනය (රුපියල් දශලක්ෂ 662) යන කාර්යයන් සඳහා වැය වූ මුළු වර්තන වියදම, 1996 වර්ෂයේ මුළු වර්තන වියදමින් සියයට 88 ක් විය. කාර්යයන් අනුව වියදම සැලකීමේදී මුළු වර්තන වියදමින් සියයට 87 ක් හෙවත් රුපියල් දශලක්ෂ 18,166 ක් සමාජ සේවා කටයුතු සඳහා වැය කරන ලදී. මේ අතර, ආර්ථික සේවා සහ පළාත් පරිපාලනමය කටයුතු සඳහා වූ වර්තන වියදම් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 834 ක් සහ රුපියල් දශලක්ෂ 1,942 වූ අතර, මුළු වර්තන වියදමින් මෙම අංශ සඳහා වූ වියදම පිළිවෙලින් සියයට 4 ක් හා සියයට 9 ක් විය. පසුගිය වසරේදී මීට අනුරූප ප්‍රතිශතයන් සියයට 86, 4 සහ 10 විය.

පළාත් සභාවන්හි ආදායම් සැසඳීමේදී දක්නට ඇති විෂමතාව සැලකූ විට වර්තන වියදම් ව්‍යාප්තිය සෑම සභාවකම එක්තරා සමානුරූපී බවක් පෙන්නුම් කරයි. බස්නාහිර පළාත් සභාවෙහි 1996 වර්ෂයේ වර්තන වියදම රුපියල් දශලක්ෂ 4,994 ක් හෙවත් මුළු වර්තන වියදමින් සියයට 24 ක් වූ නමුදු අනිකුත් සියලුම පළාත් සභාවල වර්තන පිරිවැය පළාත් සභාවල මුළු පිරිවැයින් සියයට 7 - 14 අතර පැවතුනි.

ප්‍රාග්ධන වියදම 1995 වර්ෂයේ වාර්තා වුණු රුපියල් දශලක්ෂ 1,057 හා සැසඳීමේදී 1996 වර්ෂයේදී සියයට 12 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 1,187 ක් විය. භාණ්ඩ මිලදී ගැනීම්, ඉදිකිරීම් හා භූමිය වැඩිදියුණු කිරීම සඳහා රුපියල් දශලක්ෂ 757 ක් වැය වූ අතර, එය මුළු ප්‍රාග්ධන වියදමින් සියයට 64 ක් විය. මෙය පසුගිය වර්ෂයෙන් වැය වූ රුපියල් දශලක්ෂ 594 හා සැසඳීමේදී සියයට 27 ක වර්ධනයකි. මෙයට අමතරව විෂයභාර අමාත්‍යාංශවලට අදාල ප්‍රාග්ධන වියදම් සම්බන්ධිත කාර්යයන් පළාත් සභා මගින් ඉටු කිරීමට පවරාගෙන ඇති අතර ඒ සඳහා අවශ්‍ය මුදල් මධ්‍යකාලීන ආයෝජන වැඩ සටහන යටතේ ලබාදෙනු ලැබේ.

1995 වර්ෂයේ රුපියල් දශලක්ෂ 15,355 ක් වූ පළාත් සභා මෙහෙයුම් අලාභය හා සැසඳීමේදී 1996 වර්ෂයේදී එය රුපියල් දශලක්ෂ 16,057 ක් විය. 1995 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 15,355 ක් වූ මුළු අයවැය හිඟය හා සැසඳීමේදී 1996 වර්ෂයේදී එය රුපියල් දශලක්ෂ 17,244 ක් විය. මෙහෙයුම් අලාභය පියවීම සඳහා 1996 වර්ෂයේදී මධ්‍යම ආණ්ඩුව මගින් රුපියල් දශලක්ෂ 15,851 ක සාමුහික ප්‍රදානයක් ලබාදුන් අතර එය පසුගිය වර්ෂයේදී රුපියල් දශලක්ෂ 14,066 ක් විය. මීට අමතරව ප්‍රාග්ධන වියදම් සඳහා මධ්‍යම ආණ්ඩුව මගින් රුපියල් දශලක්ෂ 800 උපමාන පාදක ප්‍රදාන ලබාදුනි. එය 1995 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 857 ක් විය. ප්‍රාග්ධන වියදම් සඳහා ඉතිරි මුල්‍ය අවශ්‍යතා මධ්‍යම ආණ්ඩුව මගින් සපයන ලද අනුරූපිත ප්‍රදානයන් මගින් සැපිරිණි.

## 8.6 රාජ්‍ය ව්‍යවසායය ප්‍රතිසංස්කරණ

1996 අංක 1 දරණ ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසායය ප්‍රතිසංස්කරණ කොමිෂන් පනත යටතේ රාජ්‍ය ව්‍යවසායය ප්‍රතිසංස්කරණ කොමිෂම (පර්ක්) පිහිටුවනු ලැබීය. කොමිෂන් සභාවේ, ප්‍රධාන කර්තව්‍යයන් නම් ආර්ථික සංවර්ධනය කඩිනම් කිරීම, අන්තර් ජාතික වෙළෙඳපළ වලට ප්‍රවේශය සහිතව නිෂ්පාදනය සහ සේවා උසස් තත්ත්වයකට පත්කිරීම, නව තාක්ෂණය සහ විශේෂඥ දැනුම අත්කර ගැනීම, ප්‍රාග්ධන වෙළෙඳ පොළ දියුණු කිරීම සහ පුළුල් කිරීම, දීර්ඝකාලීන පුද්ගලික ඉතිරි කිරීම් සංචලනය කිරීම, පෞද්ගලික අංශයේ උනන්දුව ඇති කිරීම සහ රජයේ ආදායම් වර්ධනය කිරීම අරමුණු කරමින් රාජ්‍ය ව්‍යවසායය ප්‍රතිසංස්කරණය පිළිබඳව රජයට උපදෙස්දීම සහ සහාය වීම වන අතර මෙමගින් සමාජ කටයුතු වඩා හොඳින් ඉටුකර දීමට හැකි වේ.

1996 දී රාජ්‍ය ව්‍යවසායය ප්‍රතිසංස්කරණ වැඩ සටහන යටතේ රුපියල් දශලක්ෂ 4,661 ක් ජනනය කරන ලදී. ඔරියන්ට් ලංකා සමාගමේ කොටස් වලින් සියයට 60 ක් සහ ලංකා වානේ සංස්ථාවේ කොටස් වලින් සියයට 90 ක් පැවරීම මගින් පිළිවෙළින් රුපියල් දශලක්ෂ 1,000 ක් සහ

## සංඛ්‍යා සටහන 8.6
## පෞද්ගලීකරණ ලැබීම් 1996 (අ)

| ව්‍යවසායයේ නම | වැඩි කොටස් අයිතිය විකිණීම | | | පොදු කොටස් නිකුතුව | | ලැබුණු මුළු මුදල |
|---|---|---|---|---|---|---|
| | පවරාදීම් ලැබීම්% | දේශීය රු. දශ ලක්ෂ | විදේශ රු. දශ ලක්ෂ | පවරාදීම් ලැබීම් % | ලැබුණු ප්‍රමාණය | |
| **වැවිලි සමාගම්** | | | | | | |
| සී/ස වටවල වැවිලි සභාව (ආ) | 51 | 295.40 | - | - | - | 295.40 |
| සී/ස හොරණ වැවිලි සමාගම (ආ) | 51 | 85.80 | - | - | - | 86.80 |
| සී/ස මස්කෙලිය වැවිලි සමාගම | 51 | 219.30 | - | - | - | 219.30 |
| සී/ස මඩොල්සිම වැවිලි සමාගම | 51 | 102.00 | - | - | - | 102.00 |
| සී/ස ආගරපතන වැවිලි සමාගම | 51 | 267.87 | - | - | - | 267.87 |
| සී/ස හපුගස්තැන්න වැවිලි සමාගම | 51 | 242.25 | - | - | - | 242.25 |
| සී/ස බලන්ගොඩ වැවිලි සමාගම | 51 | 420.75 | - | - | - | 420.75 |
| සී/ස උඩපුස්සැල්ලාව වැවිලි සමාගම | 51 | 316.14 | - | - | - | 316.14 |
| **වෙනත් ව්‍යවසායයන්** | | | | | | |
| සී/ස ඔරියන්ට් ලංකා | 60 | - | 1,000.00 | - | - | 1000.00 |
| සී/ස කුඩා තේ කම්හල් අයිතිකරුවන් | - | - | - | 39 | 64.60 | 64.05 |
| සී/ස රජරට කෘෂි පොහොර සමාගම | 90 | 60.05 | - | - | - | 60.05 |
| සී/ස ලංකා ලුබ්රිකන්ට් | - | - | - | 39 | 547.24 | 547.24 |
| ලංකා වාහේ | 90 | - | 849.45 | - | - | 849.45 |
| එකතුව | | 2,010.156 | 1,849.45 | - | 611.84 | 4,471.85 |

(අ) කොළඹ කොටස් වෙළෙඳපොළ කොමිස් සහ අනෙකුත් සේවා ගාස්තු ගෙවීමෙන් පසුව පවරාදීම් ලැබීම්වල ශුද්ධ රාජ්‍ය ගිණුම් වල පෙන්නුම් කරයි.

(ආ) පහත සඳහන් පරිදි අත්තිකාරම් ගෙවීම 1995 දී ලැබුණු අතර ශේෂ ගෙවීම 1996 දී ලැබී ඇත.
සී/ස වටවල වැවිලි සමාගම රු. දශ ලක්ෂ 10.6
සී/ස හොරණ වැවිලි සමාගම රු. දශ ලක්ෂ 15.2

මූලයයන් :- රාජ්‍ය ව්‍යවසායය ප්‍රතිසංස්කරණ කොමිසම

රුපියල් දශලක්ෂ 849 ක ආදායමක් රජයට ලැබුණු අතර එම ලැබීම් මුළු ප්‍රමාණයම විදේශීය මූලාශ්‍රයන්ගෙන් විය.

වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය තුළ වැවිලි සමාගම් හයක් එනම්, මස්කෙලිය වැවිලි සමාගම, මඩොල්සිම වැවිලි සමාගම, ආගරපතන වැවිලි සමාගම, හපුගස්තැන්න වැවිලි සමාගම, බලංගොඩ වැවිලි සමාගම සහ උඩපුස්සැල්ලාව වැවිලි සමාගම 1996 දී පුද්ගලීකරණය කළ අතර, එම සමාගම්හි කොටස් හිමිකමෙන් සියයට 51 ක ප්‍රමාණයක් පවරා දෙනු ලැබීමෙන් රජයට ලැබුණු ආදායම රුපියල් දශලක්ෂ 1,568 කි. 1996 දී වටවල වැවිලි සමාගමේ සහ හොරණ වැවිලි සමාගමේ කොටස් හිමිකමෙන් සියයට 51 ක් පවරා දීමෙන් පසු රුපියල් දශලක්ෂ 362 ක් ලැබුණු අතර ඊට අතිරේකව 1995 වසරේදී රුපියල් දශලක්ෂ 26 ක අත්තිකාරම් වශයෙන් ලැබිනි. 1995 දී අගලවත්ත සහ කැළණිවැලි වැවිලි සමාගම්හි සියයට 51 කොටස් ආදායමින් කොටසක් සහ එම සමාගම්හි සියයට 20 ක් වූ කොටස් මහජනයා වෙත නිකුත් කිරීමෙන් 1996 වසරේදී ලැබූ මුළු ආදායම රුපියල් දශලක්ෂ 123 කි. ඉහත සඳහන් කරන ලද වැවිලි සමාගම් 10 න් 1996 වසර තුළ ලැබූ මුළු පුද්ගලීකරණ ආදායම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1,111 ක් වූ අතර එය 1996 වර්ෂයේ මුළු පුද්ගලීකරණ ලැබීම් වලින් සියයට 45 ක් විය.

1996 දී ලංකා ලුබ්රිකන්ට් සමාගමෙහි සහ කුඩා තේ වතු කර්මාන්තශාලා හිමියන්ගේ සංගමයෙහි මහජනයා වෙත නිකුත් කළ සියයට 39 ක් වූ කොටස් වලින් රුපියල් දශලක්ෂ 612 ක් ලැබුණු අතර එය මෙම ව්‍යවසායයන් දෙක 1994 දී පවරා දුන් අවස්ථාවේදී සියයට 51 ක කොටස් වලින් එකතු කරගත් රුපියල් දශලක්ෂ 318 ට අමතරව වේ.

රජරට කෘෂි පොහොර සමාගමෙහි කොටස් සියයට 90ක් පවරාදීමෙන් රුපියල් දශලක්ෂ 60 ක් උපයා ගන්නා ලදී. 1996 වසර තුළදී ලංකා තුනි ලැලි නිෂ්පාදන සමාගම, රුහුණු කෘෂි පොහොර සමාගම සහ වයඹ කෘෂි පොහොර සමාගම පිළිවෙලින් 1993, 1994 හා 1995 වර්ෂ වලදී පුද්ගලීකරණය කිරීමෙන් පසු වාරික වශයෙන් කරනු ලැබන ගෙවීම් යටතේ 1996 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 18 ක් ලබාදුනි.

පුද්ගලීකරණය කරන ලද රාජ්‍ය ව්‍යවසායයන්හි සේවය කරන සේවකයන්ට කොටස් අයිතිය පැවරීම ද 1996 වසර තුළදී ක්‍රියාත්මක කරන ලදී. ප්‍රාග්ධන සංවර්ධන ආයෝජන සමාගම කොටස් අයිතින් සියයට 1.1 ක්ද, ඔරියන්ට් ලංකා සමාගම කොටස් වලින් සියයට 3 ක්ද, ෂෙල් ගෑස් ලංකා සමාගම, කුඩා තේ වතු හිමියන්ගේ සමාගම, ලංකා පිගන් සමාගම සහ පුත්තලම සිමෙන්ති සමාගම යන ව්‍යවසායයන්හි කොටස් වලින් සියයට 10 බැගින්ද එම සමාගම් සේවකයන්ට තෑගි කරන ලදී.

ඉකුත් කාලසීමාවේදී රාජ්‍ය ව්‍යවසායය ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්ති යටතේ රාජ්‍ය ව්‍යවසායයන් පුද්ගලීකරණය කිරීමේදී අනුගමනය කරන ලද උපාය මාර්ගයන් නිසා පුද්ගලීකරණය කරන ලද ආයතනයන්හි උද්ගත වූ ප්‍රධාන ගැටලු වලට විසඳුම් ලබාදීමද 1996 දී සිදු කරන ලදී. මෙම ගැටලු විසඳීම සඳහා පුද්ගලීකරණය කරන ලද රාජ්‍ය ව්‍යවසායය පුනරුත්ථාපනය කිරීමේ පනත සම්මත කරන ලදී. පවරා දෙනු ලැබූ එවැනි සමාගම්වල ව්‍යාපාර කටයුතු අසාර්ථක වී එහි ප්‍රතිඵලයක් වශයෙන් එවැනි සමාගම්වල සේවකයින් සේවයෙහි නියුක්ත නොකිරීම, සේවකයින් ඉවත් කිරීම, ඔවුන්ගේ වේතන සහ එකී සමාගම්වල සේවකයින් හට ව්‍යවස්ථාපිතව සිදුකළ යුතු ගෙවීම් නොකිරීම නිසා ජාතික ආර්ථිකයේ යහපත සඳහා ද, ඒ සමාගම්වල කම්කරුවන්ගේ අයිතිවාසිකම් පිළිගැනීම සහ ඒවාට ගරු කිරීම පිණිස උචිත පියවර ගැනීමට රජයට මේ පනතින් බලය දෙනු ලැබේ.

**සංඛ්‍යා සටහන 8.7**

**පෞද්ගලිකරණය කරන ලද අසාර්ථක වූ රාජ්‍ය ව්‍යවසායයන්**

| | සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | සී/ස කන්තලේ සීනි සමාගම | සී/ස හිඟුරාන සීනි සමාගම | සී/ස කහටගහ මිනිරන් ලංකා සමාගම | සී/ස ලංකා ලෝහ සමාගම | සී/ ස මත්තේගම පෙහෙකම්හල |
|---|---|---|---|---|---|---|
| විකුණන ලද කොටස්වල ප්‍රතිශතය | 90 | 90 | 90 | 90 | 90 | 90 |
| සේවකයින්ට ප්‍රදානය කළ කොටස්වල ප්‍රතිශතය | 10 | - | 10 | 10 | 10 | 10 |
| මෙහෙයුම් නැවතුන මාසය | දෙස. - 1994 | ජූලි - 1994 | නොවැ. - 1996 | නොවැ. - 1994 | මැයි - 1996 | ජූනි - 1996 |
| සේවක සංඛ්‍යා ප්‍රමාණය | 330 | 500 (සේවයෙහි නියුතු විය හැකි) | 1,290 | 700 | 300 | 1,002 |
| නොගෙවූ වේතන, සේ.අ.අ., සේ. භා. අ. ආදිය | 94 දෙසැම්බර් සම්පූර්ණයෙන් | 94 ජූලි සිට සම්පූර්ණයෙන් | රු. ද. ලක්ෂ 47.1 | 94 දෙසැම්බර් සිට සම්පූර්ණයෙන් | 94 දෙසැම්බර් සිට සම්පූර්ණයෙන් | රු. ද. ලක්ෂ 10.5 |

මූලය :- මහා භාණ්ඩාගාරය

රාජ්‍ය ව්‍යවසායය පුනරුත්ථාපන පනත පනවනු ලබන අවස්ථාවේදී එම පනත මගින් නිර්වචනය කර ඇති ලෙස අසාර්ථක වූ පුද්ගලිකරණය කරන ලද රාජ්‍ය ව්‍යවසායයන් 6 ක් පුනරුත්ථාපනය කළ යුතු තත්ත්වයේ පැවතුනි. එම සමාගම් නම් කොළඹ කොමර්ෂල් පොහොර සමාගම, කන්තලේ සීනි කර්මාන්ත සමාගම, හිඟුරාන සීනි සමාගම, කහටගහ මිනිරන් ලංකා සමාගම, ලංකා ලෝහ හාඩ්වෙයාර් සමාගම සහ මත්තේගම පෙහෙකම්හල වේ. රාජ්‍ය ව්‍යවසායය ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළදී, මෙම රාජ්‍ය ව්‍යවසායයන් හයෙහිම සියයට 90 ක කොටස් ප්‍රමාණයක් පවරා දෙන ලදී. 1996 ජූනි මස වන විට මෙම සමාගම් සියල්ලම වාණිජ කටයුතුවල නිරත වී නොතිබණි.


රජය විසින් ඉකුත් කාලසීමාවේදී රාජ්‍ය ව්‍යවසායයනට දෙන ලද ණය සඳහා ආපසු ගෙවීම් රුපියල් දශලක්ෂ 3,473 ක් වූ අතර ඉන් රුපියල් දශ ලක්ෂ 1,578 ක් ලංකා විදුලි බල මණ්ඩලය විසින් ගෙවන ලදී. රාජ්‍ය බැංකු දෙකෙහි ප්‍රතිව්‍යුහකරණ වැඩ සටහන සඳහා නිකුත් කරන ලද රාජ්‍ය බැඳුම්කර මත වාර්ෂික පොලී ගෙවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,891 ක් විය. 1996 වසර තුළදී මහජන බැංකුව, ලංකා බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙත නිකුත් කරන ලද දීර්ඝකාලීන රාජ්‍ය බැඳුම්කර පිළිවෙලින් රුපියල් දශලක්ෂ 10,056 ක්, රුපියල් දශලක්ෂ 9,336 ක් සහ රුපියල් දශලක්ෂ 4,480 ක් විය.

## 8.7 අයවැය හිඟය පියවීම

1996 වර්ෂයේ අයවැය හිඟය රුපියල් දශලක්ෂ 59,932 ක් විය. අයවැය පරතරය පියවීම සඳහා ලැබූ දළ විදේශීය ණය ගැනීම් ප්‍රමාණය සියයට 28 ක තියුණු පහත වැටීමක් පෙන්නුම් කරමින් රුපියල් දශලක්ෂ 21,402 ක් වූ අතර විදේශීය ණය ආපසු ගෙවීම් වැඩිවීම හේතුකොට ගෙන ශුද්ධ විදේශ ණය ගැනීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 10,911 ක් දක්වා අඩු විය. දළ විදේශීය ණය ගැනීම් ප්‍රමාණය 1996 අයවැයෙන් අපේක්ෂිත ප්‍රමාණයට වඩා සියයට 24 කින් පහත වැටිණ. විදේශ සම්පත්වල මෙම ඌණ උපයෝජනය සඳහා බලපෑ ප්‍රධාන හේතුන් වූයේ, විශේෂයෙන්ම බලශක්තිය, මාර්ග සංවර්ධනය, විදුලි සංදේශ සහ ජල සම්පාදනය යන අංශවල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් සහ විදේශීය ආධාර ප්‍රතිපූර්ණය කිරීමේ පදනම යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා ආයෝජනය කළ යුතු දේශීය සම්පත් සීමාවීම වේ. 1996 දී දළ විදේශීය ණය ගැනීම් වලින් සියයට 35 ක් නියෝජනය කළ ජපන් යෙන් මුදලට එරෙහිව දේශීය ව්‍යවහාර මුදලෙහි අගය ඉහළයාම (1996 දී ජපන් යෙන් මුදලට එරෙහිව රුපියල් අගය වැඩිවීම සියයට 7 කි) නිසා ජපාන යෙන් මුදල් යටතේ ලැබූ විදේශ ණය ප්‍රමාණයේ රුපියල් අගය අඩු විය. ශුද්ධ විදේශීය ණය ගැනීම් ප්‍රමාණය, දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් ගත්විට 1995 දී වූ සියයට 3.2 සිට 1996 දී සියයට 1.4 දක්වා පහත වැටිණ. මේ අතර මුළු අයවැය හිඟයේ (ප්‍රදානයන්ට පසු) ප්‍රතිශතයක් ලෙස විදේශීය ණය මගින් මූල්‍යකරණය සැලකීමේදී 1995 දී පැවැති සියයට 38 සිට 1996 දී සියයට 18 දක්වා පහත වැටිණ.

1996 දී රාජ්‍ය මූල්‍ය කටයුතු වල විශාල සම්පත් පරතරය පිළිබිඹු කරමින් රුපියල් දශලක්ෂ 49,020 ක් වූ දේශීය මූලාශ්‍රයන්ගෙන් ලබාගනු ලැබූ ශුද්ධ ණය ගැනීම්, ඉකුත් වසරේ වාර්තා වූ මට්ටම වූ රුපියල් දශ ලක්ෂ 33,972 ට වඩා සියයට 44 ක වැඩිවීමක් වාර්තා කළේය. දළ දේශීය නිෂ්පාදිතයට සමානුපාතිකව ශුද්ධ දේශීය සම්පත් මගින්. අයවැය හිඟය මූල්‍යකරණය කිරීම 1996 වසරේදී සියයට 6.4 ක් වූ අතර, අයවැය හිඟයේ කොටසක් ලෙස (ප්‍රදානයන්ට පසුව) එය සියයට 82 ක් විය. දේශීය මූලාශ්‍රයන්ගෙන් ලබාගත් මුළු ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 12,344 ක් වූ බැංකු ණය ගැනීම් වලින් හා රුපියල් දශලක්ෂ 36,616 ක් වූ බැංකු නොවන ණය ගැනීම් වලින් සමන්විත වූ අතර එහි දේශීය මූලාශ්‍ර වලට ගෙවිය යුතු හිඟ ණය රුපියල් දශලක්ෂ 2,715 ක් ද ඇතුළත් වේ.

අයවැය හිඟය පියවීම සඳහා රුපියල් ණය, භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම සහ වෙනත් ණය ගැනීම් මගින් බැංකු නොවන දේශීය මූලාශ්‍රයන්ගෙන් ලබාගත් දළ ණය ප්‍රමාණය ඉකුත් වසරේ වූ රුපියල් දශ ලක්ෂ 54,976 හා සසඳන විට 1996 දී රුපියල් දශලක්ෂ 56,710 ක් විය. රුපියල්




රූප සටහන 8.4
අයවැය හිඟය පියවීම

ණය වැඩසටහන මගින් ලබාගත් දළ ණය ප්‍රමාණය ඉකුත් වසරේදී වූ රුපියල් දශලක්ෂ 46,717 හා සසඳන විට 1996 දී රුපියල් දශලක්ෂ 46,878 ක් විය. කෙසේ වුව ද රුපියල් දශලක්ෂ 22,567 ක් වූ ආපසු ගෙවීමේ සැලකිල්ලට ගත්විට රුපියල් ණය වැඩ සටහන මගින් ලබාගත් ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 24,174 වූ අතර, එය 1995 වසරේදී පැවැති රුපියල් දශලක්ෂ 20,886 හා සැසඳිය හැක. ඉකුත් වර්ෂයන්හි මෙන්ම, රුපියල් ණය වැඩසටහනේ අඛණ්ඩ ප්‍රධාන දායකයා වූ සේවක අර්ථ සාධක අරමුදල (සේ. අ. අ. ) 1996 දී දායක වූ ප්‍රමාණය රුපියල් දශලක්ෂ 37,689 ක් වූ අතර 1995 වර්ෂයේදී එම ප්‍රමාණය රුපියල් දශලක්ෂ 31,420 ක් විය. මේ අතර ජාතික ඉතිරි කිරීමේ බැංකුව මගින් රුපියල් ණය සඳහා කරනු ලැබූ ආයෝජනයන් පිළිවෙලින් දෙවැනි වසරටත් පහළ යෑමේ ප්‍රවනතාවක් පෙන්විය. 1996 දී රුපියල් ණය සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ මුළු දායකත්වය වූ රුපිල් දශලක්ෂ 5,790 හා සසඳන විට 1995 දී රුපියල් දශලක්ෂ 14,429 ක් සහ 1994 දී රුපියල් දශලක්ෂ 19,595 ක් විය. මේ අතර, රුපියල් සුරැකුම් පත් මගින් අනෙකුත් බැංකු නොවන මූලාශ්‍ර වෙතින් ලබාගත් සම්පත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 3,237 ක් වූ අතර, ඉකුත් වසරේදී එය රුපියල් දශලක්ෂ 1,029 ක් විය. රුපියල් ණය වැඩ සටහන මගින් කළ දළ ණයගැනීම අඩුවීමට ප්‍රධාන හේතුව වුයේ 1996 වසර තුළදී ඍජු පාලනයට හසු නොවන මූලාශ්‍රයන්ගෙන් පරිපාලන ණය ගැනීම් මගින් අරමුදල් සපයා ගැනීමය.


නව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම මගින් වූ සම්පත් රාශිකරණය රුපියල් දශලක්ෂ 10,741 ක් විය. විවට වෙළෙඳපොළ කටයුතු හේතුවෙන් භාණ්ඩාගාර බිල්පත් හිමිකම්හි සංයුතිය වෙනස් වූ අතර එමනිසා භාණ්ඩාගාර බිල්පත්වල මහ බැංකු හිමිකම් ඉකුත් වසර අවසානයේදී වූ රුපියල් දශ ලක්ෂ 12,525 හා සසඳන විට 1996 දී රුපියල් දශ ලක්ෂ 17,100 දක්වා වැඩිවිය. ද්විතීය වෙළෙඳ පොළ කටයුතු සඳහා ගැලපීම් කළවිට, බැංකු අංශය විසින් දරණ ලද භාණ්ඩාගාර බිල්පත් හිමිකම් ප්‍රමාණය නොපිය වූ මුළු භාණ්ඩාගාර බිල්පත්වල අනුපාතයක් වශයෙන් සියයට 31 ක් විය. මේ අතර 1996 ඔක්තෝම්බරයේදී, භාණ්ඩාගාර බිල්පත් මගින් ණය ලබාගත හැකි අනුමත සීමාව වූ රුපියල් බිලියන 125 කරා ළඟාවීමත්, භාණ්ඩාගාර බිල්පත්වල අනුමත සීමාව සංශෝධනය නොකිරීමත්, වෙළෙඳපොල අරමුණු කරගත් ණය උපකරණයක් නොපැවතීමත් නිසා කෙටිකාලීන ද්‍රවශීලතා වෙළෙඳ පොළ තුළින් සම්පත් සපයා ගැනීමේදී රජයට සැලකිය යුතු අපහසුතාවයන්ට මුහුණ දීමට සිදුවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් රජය මූල්‍ය සහ මූල්‍ය නොවන ආයතනයන්ගෙන් පරිපාලන ණය ගැනීම් මගින් සපයා ගත් ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 7,648 ක් බවට පත්විය. මෙම ණය ගැනීම්වල පොලී අනුපාතය, බොහෝ විට ණය ලබාගත් අවස්ථාවෙහි භාණ්ඩාගාර බිල්පත්වල පැවැති වාර්ෂික පොලී අනුපාතයට සමාන විය.

1996 වර්ෂයේදී ඇති වූ විශාල සම්පත් පරතරය නිසා අයවැය හිඟය පියවා ගැනීමට බැංකු මගින් ණය ලබා ගැනීමට රජයට සිදුවිය. මූල්‍ය අංශයෙන් ලබාගත් මුළු ණය ප්‍රමාණය 1995 දී ලබාගත් රුපියල් දශ ලක්ෂ 7,065 හා සසඳන විට 1996 දී රුපියල් දශලක්ෂ 12,344 ක් විය. ඉන් රුපියල් දශලක්ෂ 9,873 ක් මූල්‍ය අධිකාරියෙන් ලබාගත් අතර, වාණිජ බැංකු වෙතින් ලබාගත් ණය ප්‍රමාණය රුපිල් දශලක්ෂ 2,471 ක් විය. රුපියල් දශලක්ෂ 3,995 ක් වූ තාවකාලික අත්තිකාරම් පහසුකම උපයෝජනය කිරීම හා ඊට අතිරේකව රජයේ තැන්පතු සහ මුදල් ශේෂ රුපියල් දශලක්ෂ 1,303 ක් භාවිතය සහ මහ බැංකු භාණ්ඩාගාර බිල්පත් හිමිකම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 4,575 කින් ඉහළ යාමෙහි ප්‍රතිඵල වශයෙන් 1996 දී මහ බැංකුව වෙතින් ලබාගත් මුළු ශුද්ධ ණය ගැනීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 9,873 ක් වූ අතර 1996 දී මෙය ආර්ථිකයෙහි අධිබලැති මුදල් ප්‍රසාරණයට දායක විය.

රජය විසින් නිකුත් කරන ලද රුපියල් දශලක්ෂ 19,392 ක් වූ දීර්ඝකාලීන බැඳුම්කර හැර වාණිජ බැංකු මගින් රජය ලබාගත් ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,471 කින් ඉහළ ගියේය. මෙය, 1996 දී වාණිජ බැංකු වෙතින් රජයේ ණය ගැනීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 5,890 කින් ඉහල යාම සහ වාණිජ බැංකුවල රජයේ තැන්පතු ශේෂයන් රුපියල් දශලක්ෂ 3,418 කින් වැඩිවීමේ ශුද්ධ ප්‍රතිඵලයකි. මේ නිසා 1996 දී සමස්ථ බැංකු අංශය වෙතින් රජය ලබාගත් ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 12,344 ක් විය. රජය විසින් 1996 දී බැංකු අංශයෙන් ලබාගත් දළ ණය ප්‍රමාණය සඳහා පොලී ගෙවීම් රුපියල් දශලක්ෂ 39,707 ක් විය. කෙසේ වුවද, බැංකු අංශය වෙතැති රජයේ තැන්පතු ශේෂය රුපියල් දශලක්ෂ 16,413 ක් වූ අතර ඉන් රුපියල් දශලක්ෂ 14,379 ක් පොලී ආදායමක් නොලැබෙන ජංගම ගිණුම් හි පැවතිනි. මෙම තත්ත්වය රජයේ අයවැය කටයුතු මත ඉහළ පොලී බර අඩු කිරීම පිණිස, රජයේ මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ හදිසි අවශ්‍යතාවය තවදුරටත් අවධාරණය කෙරේ.

## 8.8 රාජ්‍ය ණය

1996 වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 708,859 ක් වූ රජයේ නොපිය වූ ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 92 ක් විය. මෙයට රජය මගින් ප්‍රදානය කරන ලද කල් ඉකුත් වූ ණය පියවා දමමින් ස්වකීය වත්කම් ප්‍රති - ප්‍රාග්ධනීකරණය සඳහා රාජ්‍ය බැංකු දෙකට සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙත 1996 දී නිකුත් කරන ලද රුපියල් දශලක්ෂ 23,873 ක් වූ දස අවුරුදු බැඳුම්කර සහ 1993 දී රාජ්‍ය බැංකු දෙක සඳහා නිකුත් කරන ලද රුපියල් දශලක්ෂ 24,088 ක තිස් වසරක බැඳුම්කරද ඇතුළත්ය. 1996 තුළදී නිකුත් කරන ලද බැඳුම්කරයන් ඉවත් කළ විට 1996 දී රජයේ වූ නොපිය වූ ණය ප්‍රමාණයෙහි වැඩිවීම සියයට 8 ක් වූ අතර 1995 දී මෙය සියයට 15 ක් විය. මුළු ණය ප්‍රමාණයෙන් සියයට



**සංඛ්‍යා සටහන 8.8**

**නොපියවූ රාජ්‍ය ණය (වර්ෂය අවසානයට)**

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1992 | 1993 | 1994 | 1995 | 1996 (අ) |
|---|---|---|---|---|---|
| මුළු දේශීය ණය | 170,020 | 213,685 | 249,118 | 285,759 | 349,007 |
| කෙටිකාලීන | 97,924 | 101,845 | 108,725 | 127,471 | 142,689 |
| මැදි හා දිගුකාලීන | 72,096 | 111,840 | 140,393 | 158,289 | 206,318 |
| ණය උපකරණ අනුව | 170,020 | 213,685 | 249,118 | 285,759 | 349,007 |
| රුපියල් සුරකුම්පත් | 69,180 | 105,707 | 137,554 | 157,928 | 205,975 |
| භාණ්ඩාගාර බිල්පත් | 87,096 | 97,196 | 98,896 | 113,771 | 124,996 |
| වෙනත් | 13,744 | 10,782 | 12,669 | 14,060 | 18,036 |
| ආයතන අනුව | 170,020 | 213,684 | 249,119 | | |
| බැංකු | 58,111 | 90,134 | 100,043 | 113,356 | 156,695 |
| මහබැංකුව | 34,932 | 16,480 | 21,345 | 28,684 | 37,673 |
| වාණිජ බැංකුව | 23,179 | 73,654 | 78,698 | 84,671 | 119,022 |
| නිදහස් අරමුදල් | 359 | 239 | 137 | 100 | 100 |
| බැංකු නොවන | 111,550 | 123,311 | 148,939 | 172,304 | 192,212 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 30,782 | 37,767 | 46,407 | 48,406 | 50,652 |
| සේවක අර්ථසාධක අරමුදල | 54,563 | 65,645 | 79,745 | 95,000 | 110,431 |
| වෙනත් | 26,205 | 19,899 | 22,786 | 28,898 | 31,129 |
| විදේශීය ණය | 235,539 | 270,224 | 301,812 | 346,286 | 359,825 |
| ව්‍යාපෘති ණය | 185,003 | 216,355 | 246,075 | 286,848 | 302,470 |
| ව්‍යාපෘති නොවන ණය | 50,536 | 53,869 | 55,737 | 59,438 | 57,382 |
| ආයතන අනුව | 235,539 | 270,224 | 301,812 | 346,286 | 359,825 |
| සහනදායී ණය | 225,132 | 260,557 | 292,463 | 335,656 | 348,898 |
| වෙළඳ ණය | 10,407 | 9,667 | 9,350 | 10,630 | 10,954 |
| විදේශීය සැපයුම් කරුවන්ගේ ණය | 1,094 | 1,065 | 950 | 1,020 | 923 |
| **නොපියවූ මුළු රාජ්‍ය ණය** | **405,559** | **483,909** | **550,930** | **632,045** | **708,859** |
| නිදහස් අරමුදල් අත්හල පසුව නොපියවූ මුළු රාජ්‍ය ණය | 405,199 | 483,589 | 550,793 | 631,945 | 708,759 |

(අ) 1993 දී සහ 1996 දී නිකුත් කල රු. දශලක්ෂ 24,088 සහ රු. දශලක්ෂ 23,873ක් වූ දිගුකාලීන බැඳුම්කර ඇතුලත්ය.

මූලය - ශ්‍රී ලංකා මහ බැංකුව

49 ක් වූ දේශීය ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 349,007 ක් වූ අතර, සියයට '51 ක් වූ ඉතිරිය, රුපියල් දශලක්ෂ 359,852 ක් වූ විදේශීය ණය නියෝජනය කළේය.

## දේශීය ණය

1996 වසරේ නිකුත් කරන ලද දිගුකාලීන බැඳුම්කර හැර රුපියල් දශලක්ෂ 325,174 ක් වූ නොපිය වූ ණය ප්‍රමාණය සියයට 14 ක වැඩිවීමක් වාර්තා කළ අතර ඉකුත් වසරේදී එම වැඩිවීම සියයට 15 ක් විය. රුපියල් දශලක්ෂ 142,689 ක් වූ කෙටි කාලීන ණය (කල්පිරීමේ කාල සීමාව එක් වසරක් හෝ ඊට අඩු) මුළු දේශීය ණය ප්‍රමාණයෙන් සියයට 41 ක් වූ අතර 1995 දී මෙම අනුපාතය සියයට 45 ක් විය. භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම් සීමිත වීම නිසා කෙටි කාලීන ණය උපකරණයන් මගින් ණය ගැනීම අඩු වූ අතර එමනිසා ඉකුත් වසරේදී සියයට 17 කින් වර්ධනය වූ කෙටිකාලීන ණය ගැනීම් 1996 වසරේදී වර්ධනය වූයේ සියයට 12 කින් පමණි. රුපියල් බිලියන 125 ක් වූ භාණ්ඩාගාර බිල්පත් සඳහා අනුමත සීමාව ඉහළ නොදනමු ලැබූ නිසාත්, එම සීමාවට 1996 ඔක්තෝබර් වලදී ළඟා වූ නිසාත්, නව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම මගින් ලබාගත් මුළු ණය ප්‍රමාණය 1995 දී වූ රුපියල් දශලක්ෂ 14,875 හා සසඳන විට, මෙම වසරේදී රුපියල් දශලක්ෂ 11,225 කට අඩුවිය. භාණ්ඩාගාර බිල්පත් මත නොපිය වූ වගකීම වූ රුපියල් දශලක්ෂ 124,996 , මුළු කෙටිකාලීන ණය ප්‍රමාණයෙන් සියයට 88 ක් විය. මේ අතර කෙටිකාලීන ණය වලින් සියයට 12 ක් වූ ඉතිරිය නියෝජනය කළ මහ බැංකු තාවකාලික අත්තිකාරම්හි නොපිය වූ ශේෂය, 1996 වසර අවසානයේදී සියයට 29 කින් ඉහළ යමින් රුපියල් දශලක්ෂ 17,693 ක් විය. 1996 දී නිකුත් කරන ලද ලද රුපියල් දශ ලක්ෂ 23,873 ක් සහ 1993 දී නිකුත් කරන ලද රුපියල් දශලක්ෂ 24,088 ක් වූ දිගුකාලීන ප්‍රතිව්‍යුහගත බැඳුම්කරද ඇතුලත්ව මැදි හා දිගුකාලීන ණයවල නොපියවූ වගකීම රුපියල් දශලක්ෂ 206,318 ක් වූ අතර එය 1996 අවසානයේදී පැවැති මුළු දේශීය ණය ප්‍රමාණයෙන් සියයට 59 ක් නියෝජනය කරන ලදී. රජයේ මැදි හා දිගුකාලීන දේශීය ණය සම්පූර්ණ ප්‍රමාණයම පාහේ රුපියල් සුරැකුම්පත් මගින් නියෝජනය කළේය.

රුපියල් දශලක්ෂ 47,961 ක් වූ දිගු කාලීන ප්‍රතිව්‍යුහගත බැඳුම්කර දෙකද ඇතුළත්ව රුපියල් සුරැකුම්පත්වල නොපියවූ වගකීම, 1996 අවසානයේදී රුපියල් දශලක්ෂ 205,975 ක්ව පැවතිනි. 1996 දී අයවැය හිගය පියවීම සඳහා නිකුත් කරන ලද මුළු රුපියල් සුරැකුම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 46,716 ක් වූ අතර, රුපියල් දශලක්ෂ 22,543 ක් වූ මුළු ආපසු ගෙවීම්වලින් අඩුකළ විට එහි ශුද්ධ වැඩිවීම (දිගුකාලීන බැඳුම්කර හැර) රුපියල් දශලක්ෂ 24,173 ක් විය. 1996 වසර තුළදී නිකුත් කරන ලද රුපියල් ණය සඳහා කල්පිරීමේ කාලසීමාව වසර දෙක සිට අට දක්වා වූ අතර වාර්ෂික පොලී අනුපාතිකය 13.5 - 15.0 දක්වා පරාසයක විය. සියයට 15 ක් වූ වාර්ෂික ඉහළ පොලී අනුපාතිකයකින් යුත් වසර දෙකක කල්පිරීමෙන් යුත් රුපියල් සුරැකුම්පත් නිකුත් කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ භාණ්ඩාගාර බිල්පත්වලට විකල්ප වශයෙන් ආකර්ශනීය ණය උපකරණයක් ලෙස ක්‍රියා කරමින් රජයේ සෘජු පාලනයකට හසු නොවන මූලයන්ගෙන් අරමුදල් එක්රැස් කරගැනීමය. 1996 වසර අවසානයේදී, සේවක අර්ථ සාධක අරමුදල (සේ.අ.අ.)සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව නොපියවූ මුළු රුපියල් සුරැකුම්පත් ප්‍රමාණයෙන් සියයට 75 ක් නියෝජනය කරමින්, රුපියල් ණය වැඩසටහනේ ප්‍රධාන දායකයන් දෙදෙනා ලෙස තවදුරටත් පැවතුනි. දිගුකාලීන ප්‍රතිව්‍යුහගත බැඳුම්කර දෙකක් නිකුත් කර තිබීමේ හේතුවෙන් රාජ්‍ය බැංකු දෙක මුළු නොපිය වූ සුරැකුම්පත් ප්‍රමාණයෙන් සියයට 22 ක් හිමිකරගත් අතර, දිගු කාලීන බැඳුම්කර හැර නොපියවූ රුපියල් සුරැකුම්පත් සම්පූර්ණ ප්‍රමාණයම වාගේ බැංකු නොවන මූලාශ්‍රයන් විසින් දරන ලදී.

1996 වසරේදී කල්පිරීමේ කාලසීමාව වර්ෂ 10 ක් වූ සහ පොලී අනුපාතිකය සියයට 14 ක් වූ රුපියල් දශලක්ෂ 23,873 ක් වන දිගුකාලීන බැඳුම්කර රාජ්‍ය බැංකු දෙක (මහජන බැංකුවට රුපියල් දශ ලක්ෂ 10,056.3 සහ ලංකා බැංකුවට රුපියල් දශලක්ෂ 9,336.3 සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව රුපියල් දශලක්ෂ 4479.9) වෙත රජය විසින් නිකුත් කරන ලදී. විවිධ ව්‍යාපෘතීන් සඳහා රජයේ සහතිකය යටතේ ප්‍රදානය කරන ලද කල් ඉකුත්වූ ණය පියවා දමමින් ස්වකීය වත්කම් ප්‍රති-ප්‍රාග්ධනීකරණය කිරීම මෙම බැඳුම්කරයන් නිකුත් කිරීමේ පරමාර්ථය විය.

## විදේශ ණය

1996 වර්ෂය අවසානයේදී විදේශීය ණය මත නොපිය වූ වගකීම් රුපියල් දශලක්ෂ 359,852 ක් වූ අතර, එය ඉකුත් වසර අවසානයේ වාර්තා වූ මට්ටමට වඩා සියයට 4 ක හෙවත් රුපියල් දශලක්ෂ 13,566 ක වැඩිවීමකි. මෙම විදේශීය ණය වැඩිවීම, දළ විදේශීය ණය ගැනීම රුපියල්

**සංඛ්‍යා සටහන 8.9**
**විනිමය අනුපාතිකයේ විචලනයන් විදේශීය ණය කෙරෙහි ඇති කළ බලපෑම 1992 - 1996 (අ)**

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1992 | 1993 | 1994 | 1995 | 1996 (ආ) |
|---|---|---|---|---|---|
| දළ ලැබීම් | 15,316 | 16,839 | 19,384 | 24,359 | 24,434 |
| ආපසු ගෙවීම් | 7,955 | 6,984 | 7,606 | 8,477 | 8,939 |
| ශුද්ධ ලැබීම් | 7,361 | 9,855 | 11,778 | 15,882 | 15,495 |
| විනිමය අනුපාතිකයේ විචලනය | | | | | |
| නිසා වගකීමේ ඇතිවූ වෙනස | 13,599 | 24,831 | 19,810 | 28,592 | -1,929 |
| කාලච්ඡේදය අවසානයෙහි වගකීම | 235,538 | 270,224 | 301,812 | 346,286 | 359,852 |

(අ) ලැබුන දිනය අනුව වටිනාකම සටහන් කිරීමේ ක්‍රමය පදනම් කොට ඇත.

මූලය - ශ්‍රී ලංකා මහ බැංකුව

(ආ) තාවකාලික

දශලක්ෂ 24,435 කින් වැඩිවීමේ හා රුපියල් දශලක්ෂ 8,939 ක ණය ආපසු ගෙවීමේත්, විනිමය අනුපාතිකයේ විචලනය හේතුවෙන් උද්ගතවූ රුපියල් දශලක්ෂ 1,929 කින් වගකීම අඩුවීමෙත් ශුද්ධ ප්‍රතිපලයක් සේ සැලකිය හැකිය.

සහනදායී ණයවල නොපිය වූ වගකීම 1996 අවසානයේදී ඉකුත් වසරට වඩා සියයට 4 කින් හෙවත් රුපියල් දශලක්ෂ 13,242 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 348,898 ක් විය. මෙම වැඩිවීම රුපියල් දශලක්ෂ 23,370 ක දළ ලැබීම්, රුපියල් දශලක්ෂ 7,665 ක ආපසු ගෙවීම් සහ විනිමය අනුපාතිකයේ විචලනය හේතුවෙන් රුපියල් දශලක්ෂ 2,463 න් වගකීම අඩුවීමේ ශුද්ධ ප්‍රතිඵලයකි. ඉකුත් වසරේදී මෙන්ම, මුළු නොපියවූ විදේශීය ණය ප්‍රමාණයෙන් සහනදායී ණය ප්‍රමාණය සියයට 97 ක්ව පැවතිණ. මුළු සහනදායී ණය ප්‍රමාණයෙන් සියයට 54 ක් හෙවත් රුපියල් දශලක්ෂ 188,498 ක් ද්විපාර්ශ්වීය ණය වූ අතර, රුපියල් දශලක්ෂ 160,400 ක් වූ බහුපාර්ශ්වීය ණය ඉතිරි සියයට 46 නියෝජනය කළේය. 1996 වසර අවසානයේදී නොපියවා තිබූ වාණිජ ණය සඳහා වගකීම රුපියල් දශලක්ෂ 10,630 සිට රුපියල් දශලක්ෂ 10,954 දක්වා සුළු වශයෙන් වැඩිවිය.

1996 වසර අවසානයේදී ව්‍යාපෘති සහ වැඩසටහන් සම්බන්ධ ණය වගකීම රුපියල් දශලක්ෂ 15,622 කින් වැඩි වී රුපියල් දශලක්ෂ 302,470 ක් විය. මෙය රුපියල් දශලක්ෂ 23,237 ක දළ ලැබීම් රුපියල් දශලක්ෂ 5,986 ක් වූ ආපසු ගෙවීම් සහ විනිමය අනුපාතය විචලනයේ ප්‍රතිඵල වශයෙන් රුපියල් දශලක්ෂ 1,629 කින් වගකීම අඩුවීමේ ශුද්ධ ප්‍රතිඵලයකි. 1995 දී රුපියල් දශලක්ෂ 57,715 ක් වූ භාණ්ඩ ණය මත නොපිය වූ වගකීම 1996 වසර අවසානයේදී රුපියල් දශලක්ෂ 55,238 දක්වා රුපියල් දශලක්ෂ 2,477 කින් පහත වැටිණ. මීට ප්‍රධාන වශයෙන් හේතු වූයේ රුපියල් දශලක්ෂ 2,104 ක් වූ ශුද්ධ ආපසු ගෙවීම් සහ විනිමය අනුපාතයේ විචලනය මත රුපියල් දශලක්ෂ 373 කින් මුළු වගකීම අඩුවීමය. ව්‍යාපෘති සහ වැඩසටහන් ණය වලින් සියයට 98 කට ආසන්න ප්‍රමාණයක් බහුපාර්ශ්වීය සහ ද්විපාර්ශ්වීය මූලාශ්‍ර වලින් ලබාගත් අතර සියලුම භාණ්ඩ ණය ලැබුයේ ද්විපාර්ශ්වීය මූලාශ්‍ර වලිනි.

## රජයේ ණය සේවා ගෙවීම්

රුපියල් දශලක්ෂ 79,261 ක් වූ රජයේ ණය සේවා ගෙවීම් ප්‍රමාණය, පොලී ගෙවීම් රුපියල් දශලක්ෂ 46,021 කින් හා ණය ආපසු ගෙවීම් රුපියල් දශලක්ෂ 33,240 කින් සමන්විත වූ අතර එය ඉකුත් වසරට වඩා රුපියල් දශලක්ෂ 4,489 ක වැඩිවීමක් සනිටුහන් කළේය. මෙය ණය ආපසු ගෙවීම් රුපියල් දශලක්ෂ 3,306 කින් අඩුවීමෙහි සහ පොලී ගෙවීම් රුපියල් දශලක්ෂ 7,795 කින් වැඩිවීමෙහි ශුද්ධ ප්‍රතිපලයකි. තවද, දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් ණය සේවා ගෙවීම් 1995 දී වූ සියයට 11.2 සිට 1996 දී සියයට 10.3 දක්වා සැලකිය යුතු අඩුවීමක් වාර්තා කළේය.

විදේශීය ණය ආපසු ගෙවීම් රුපියල් දශලක්ෂ 2,014 කින් වැඩි වී තිබියදීත්, අඩු ප්‍රමාණයක රුපියල් සුරැකුම්පත් කල්පිරීම හේතුවෙන් දේශීය ණය ආපසු ගෙවීම් රුපියල් දශලක්ෂ 5,320 කින් පහත වැටීම හේතුවෙන් සමස්ත වශයෙන් ණය ආපසු ගෙවීම් රුපියල් දශලක්ෂ 3,306 කින් අඩු විය. 1996 දී දේශීය හා විදේශීය යන දෙපාර්ශ්වයෙහිම ණය ආපසු ගෙවීම් මුළු ණය සේවා ගෙවීම් වලින් සියයට 42 ක් විය. එම අනුපාතය ඉකුත් වසරේදී සියයට 49 ක් විය.

1996 දී දේශීය ණය මත පොලී ගෙවීම් රුපියල් දශලක්ෂ 39,284 ක් දක්වා සියයට 14 කින් වැඩිවිය. මෙය 1995 දී නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් මත වූ සැලකිය යුතු ඉහළ පොලී පිරිවැය සහ නොපිය වූ ණය ප්‍රමාණය පුළුල් වීමෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයකි. නව විදෙශ ණය ගැනීම්වල සහනදායී ස්වභාවය සහ ජපන් යෙන් මුදලට එරෙහිව ශ්‍රී ලංකා රුපියලෙහි වටිනාකම ඉහළ යාමේ ප්‍රතිලාභ පිළිබිඹු කරමින්, 1996 දී විදේශීය ණය මත පොලී ගෙවීම්, රුපියල් දශලක්ෂ 577 කින් පමණක් වැඩිවිය.

ආර්ථික වර්ගීකරණයට අනුව මුළු පොලී ගෙවීම් ප්‍රමාණය, වර්තන වියදම්වලින් සියයට 27 ක් සහ රජයේ ආදායමෙන් සියයට 31 ක් විය. රජයේ අයවැය කටයුතු කෙරෙහි පොලී ගෙවීම් මගින් ඇති කරනු

**සංඛ්‍යා සටහන 8.10**
**රාජ්‍ය ණය සේවා ගෙවීම්**

| ශීර්ෂය | 1992 | 1993 | 1994 | 1995 | 1996 (අ) |
|---|---|---|---|---|---|
| ණය සේවා ගෙවීම් | 52,018 | 57,493 | 60,702 | 74,772 | 79,261 |
| ණය ආපසු ගෙවීම් | 26,078 | 27,290 | 22,671 | 36,546 | 33,240 |
| දේශීය | 18,123 | 20,327 | 15,065 | 28,069 | 22,749 |
| විදේශීය | 7,955 | 6,963 | 7,606 | 8,477 | 10,491 |
| පොලී ගෙවීම් | 25,940 | 30,203 | 38,031 | 38,226 | 46,021 |
| දේශීය | 21,201 | 25,101 | 32,520 | 32,064 | 39,282 |
| කෙටිකාලීන | 11,923 | 13,351 | 18,712 | 13,947 | 18,942 |
| මැදි හා දිගුකාලීන | 9,278 | 11,750 | 13,808 | 18,117 | 20,340 |
| විදේශීය | 4,739 | 5,102 | 5,511 | 6,162 | 6,739 |
| පොලී ගෙවීම් / වර්තන වියදමේ ප්‍රතිශතයක් ලෙස | 28.94 | 29.53 | 29.93 | 24.80 | 26.97 |
| ණය සේවා කරණ ගෙවීම්/ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | 12.23 | 11.50 | 10.48 | 11.20 | 10.31 |

(අ) තාවකාලික

මූලය - ශ්‍රී ලංකා මහ බැංකුව

ලබන පීඩනය මෙයින් පිළිබිඹු වේ. පසුගිය වර්ෂ දෙක තුළ මුළු පොලී ගෙවීම් ප්‍රමාණය මුළු ආදායමෙහි අනුපාතයක් වශයෙන් පිළිවෙලින් සියයට 26 ක් සහ සියයට 28 ක් විය.

1995 වසර තුළදී ඉහළ පොලී අනුපාතයන් යටතේ භාණ්ඩාගාර බිල්පත් විශාල ප්‍රමාණයක් නිකුත් කිරීම සහ 1996 දී මාස තුනක කල්පිරීමෙන් යුත් භාණ්ඩාගාර බිල්පත් විශාල ලෙස නිකුත් කිරීම ද පිළිබිඹු කරමින් 1996 දී කෙටිකාලීන ණය මත පොලී ගෙවීම් රුපියල් දශලක්ෂ 18,942 ක් දක්වා සියයට 36 කින් වැඩි වුව ද 1995 දී වාර්තා වුයේ සියයට 25 ක අඩුවීමකි. ඉකුත් වසරේදී සියයට 31 කින් වැඩි වු මැදි හා දිගු කාලීන ණය මත පොලී ගෙවීම් 1996 වසරේදී සියයට 12 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශලක්ෂ 20,340 ක් විය. මෑත වර්ෂයන් තුළ අයවැය හිගය පියවා ගැනීමේදී ඉහළ පොලී සහිත රුපියල් සුරැකුම්පත් මත වැඩි වශයෙන් රැඳීමට සිදුවීම, මැදි හා දීගු කාලීන ණය සඳහා වූ පොලී පිරිවැය වැඩිවීමට හේතුවීය. මෑත කාලය තුළදී භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොලෙහි ඉහළ පොලී අනුපාතිකයක් පැවතීම නිසා විශේෂයෙන්ම, ඍජු පාලනයට හසු නොවන මුලාශ්‍රයන්ගෙන් සම්පත් ලබා ගැනීම සඳහා මැදි හා දීගුකාලීන රුපියල් සුරැකුම්පත්වල පොලී ව්‍යුහය ඉහළ මට්ටමක පවත්වා ගැනීමට අවශ්‍ය විය.